# ධමමනියාමතාවය - 4

පූජ්‍ය ඉලුකේගම අතථදස්සි සවාමීන් වහන්සේ.

පිට කවරයේ ඇතුල්පැත්ත.

# ධම්මනියාමතාවය - 4

පටිච්චසමුප්පාදය සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය
ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාව.

2021.02.13වැනි දින පවත්වන ලද
සිව්වැනි ධර්ම දේශනාව.

**අවිජ්ජා පච්චයා සංඛාරා පද වර්ණනාව.**

සංවිධානය : සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන්
විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපය.

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ.

# ධර්ම දානය පිණිසයි.

**පිටපත් කිරීම සහ සංස්කරණය:**
එච්.ඒ.අමරතුංග
(දුරකථනය 041 2240228)

**තාක්ෂණික දායකත්වය:**
චමිලා අමරතුංග

මෙම පොත නැවත මුද්‍රණය කර පිරිසිදු ධර්මදානයක් වශයෙන් නොමිලයේ බෙදාහැරීමට කැමැති සැදැහැවතෙක් වේ නම් දුරකථනයෙන් සංස්කාරක අමතා ඒ සදහා අදාල දේශකයන් වහන්සේගේ අවසරය ලබා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපයේ අනුග්‍රාහකත්වයෙන්
Skype තාක්ෂණය ඔස්සේ
අකුරැස්ස, ගල්ලල,
ඉඳිගස්හේන ආරණ්‍ය සේනාසනාධිපති,
පූජ්‍ය ඉලුක්හේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ,
පටිච්චසමුප්පාදය, සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාවේ
2021.02.13වැනි දින පවත්වන ලද
සිව්වැනි ධර්ම දේශනාව යි.

*අවිජ්ජා පච්චයා සංඛාරා පද වර්ණනාව*

**අරමුණු කරන ලද**
**මෙම ධර්ම දේශනාව**
**ඉමහත් ශ්‍රද්ධාවෙන් සහ ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුව**
**හැකිතාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම**
ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි.

සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේදී, දේශනා විලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, කාර්මික තත්ත්වය, ආදී විවිධ ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමානවේ.

කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන ආයතන නිරෝධය පිළිබඳව වූ ක්‍රම වේදය

බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදාරා පරිශීලණය කොට සමාධිමත්වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

<u>ධම්මනියාමතාවය 4</u>
<u>2021.02.13දින පැවැත්වූ</u>
<u>සිව්වැනි ධර්ම දේශනාව.</u>

***නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස***
***නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස***
***නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස***

අදත් අපි තෝරාගත් පරිදි ඒ භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ ගාම්භීර උතුම් දහම් පරියාය වන ඒ පටිච්චසමුප්පාද දේශනාව ඉදිරියෙන් තබාගෙන ක්‍රියාත්මක කරන්න යොදාගත් දේශනා මාලාව අනුව පටිච්චසමුප්පාදය පිළිබඳව මූලික විග්‍රහයන් අපි යම් යම් ආකාරයෙන් තේරුම් අරගත්තා, විග්‍රහකරගත්තා. සූත්‍ර න්‍යායයන්, ඒ වාගේ ම අට්ඨකතානුසාරයෙන් මේ පටිච්චසමුප්පාද ධර්මය අපි තේරුම්අරගන්නේ කොහොම ද කියන එක.

ඒකෙදි මම මතක්කරා, මේ පටිච්චසමුප්පාදයේ අංග දොළහේ මේ අවිජ්ජාව කියන එක විශේෂ මාතෘකාවක්. ඒක අපි ටිකක් වැඩිපුර කතාකරගන්න ඕනි කියන අදහසින් මේ අවිජ්ජාව සම්බන්ධකරගෙන අපි දේශනා දෙකක් විතර සිද්ධ කරා. බුදුරජාණන් වහන්සේ මේ පටිච්චසමුප්පාදය කොයි තැනින් පටන්ගත්තත් මේ පටිච්චසමුප්පාද චක්‍රය පෙන්නන්න පුළුවන්. එහෙම පෙන්නාපු අවස්ථා කොතෙකුත් තියෙනවා.

නමුත් අවිජ්ජාව ම මුල්කරගෙන බුදුරජාණන් වහන්සේ දේශනා කරේ මේ අවිජ්ජාව කියන කාරණාව - අවිද්‍යාව කියලා එතැන අදහස් කරේ මේ නො දන්නාකම යි කියන එක - සත්ත්ව සන්තානයේ අප්‍රහීණව පැවැතීම නිසා අනාදිමත් කාලයක් මේ සංසාරයේ දුක් උපදවන ප්‍රධාන මූල හේතුව හැටියට මේ අවිජ්ජාව කියන එක බුදුරජාණන් වහන්සේ මතුකරළා පෙන්නුවා.

ඉතින් අන්න ඒ නිසා මේ අවිජ්ජාව කියන එක හොඳාකාරව වටහාගත්තොත්, තමන් අවිද්‍යාව තුළයි ඉන්නේ කියන එක ප්‍රායෝගිකව තේරුම් ගත්තොත්, ඒක ඉතාමත්, තමන්ට ප්‍රයෝජනවත් බව අපි ගිය වර දේශනාවල දී මතක්කරා. නො දැනීම කියන එක අප තුළ ප්‍රත්‍යවෙන්නේ කොහොමද කියන එක පහණක උපමාව ආකාරයෙන් හා තවත් නොයෙක් ආකාරයෙන් හා තවත් දේවල් ආකාරයෙන්, අප තුළ මේක නො පෙණුනනත් එහෙම පරමාර්ථ ධර්මයක් අප සන්ථාන තුළ ක්‍රියාත්මක වෙමින් අපව මුලාවට පත්කරන බව, වැරැදි මනසිකාරයක් අප තුළ ඇතිකරන බව අපි කතා කරා.

ඒ නිසා අපි අවිද්‍යාව කියන එක පිළිබඳව ගිය සතියේ දේශනාවල විග්‍රහකරගත්තා මේ ස්කන්ධ-ධාතු-ආයතන වල ස්කන්ධාර්ථයෙන්, ආයතනවල ආයතනාර්ථය නො පෙන්වා මේ රූපා දී ස්කන්ධයන් සත්ත්ව-පුද්ගලභාවයෙන් අපට වැටැහෙන්නේ අප තුළ මේ නො දන්නාකම කියන එක යෙදුනහම යි කියලා.

ඒ ස්කන්ධාදිය අරභයා ම තව කෙනෙකුට ඒවාගේ යථාර්ථය වැටැහෙන්නෙත්, ඒ ස්කන්ධාදිය අරභයා මුළාව, සත්ත්ව-පුද්ගල ආදී වශයෙන් වැටැහෙන්නේත්, මෙන්න මේ යම් ධර්මතාවයන්

ශක්තියක් ක්‍රියාත්මකවෙන නිසා කියලා අපි කතාකරගත්තා. ඉතින් අන්න ඒ අවිද්‍යාව කියන එක තේරුම්ගන්නෙත් නාම, ප්‍රඥාවන්තයා කියලා හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කරා. තමන් නො දන්නා බව, අවිද්‍යාව අවිද්‍යාව හැටියට දැනගත්තොත් - මේ වචනය නෙවෙයි - තමන් තුළ තරහක් එන කොට, ලෝභයක් එන කොට දුකක් එනකොට, කණගාටුවක් එන කොට, කුමන ආකාරයේ හෝ අපට කෙලේසයක් හෝ දුකක් හෝ උපදිනකොට මේ දේ ආවේ තමන්ගේ ම අයෝනිසෝමනසිකාරය, අරමුණේ යථාර්ථය නො දන්නාකම කියන එක වටහාගත්තොත්, ඒ දුක හෝ කෙලේසය නැතිවෙන්නේ ඒ මොහොතේ ම යි කියන එක අපි තේරුම්ගත්තා. ඒකයි මේ සාසනයේ මේ ධර්මය සාන්දිට්ඨික යි, අකාලික යි කියලා කියන්නේ. යම් වෙලාවක අපේ වැරැද්ද තේරුම්ගත්තොත්, ඒකෙන් මිදෙන්නේ අපි පසුකාලයක නෙවෙයි. පහුවෙලා නෙවෙයි. ඒ මොහොතේ ම අපට ප්‍රතිපල ලැබෙනවා. අපි කොයිතරම් මුලාවෙන් කටයුතු කරත් යම් දවසක ඒ මුලාව දැනගත්තා ද, ඒ මුලාව තමන් තේරුම් අරගෙන විද්‍යාව තමන් උපදවාගත්තා ද, යම් කාලයක් මේ බොරුව කියන එක අපි ආසේවනය වුනත්, කොච්චර ආසේවන වුණත්, ඥානය ප්‍රත්‍යක්ෂ වෙච්චි මොහොතේ ම ඒ සියලු මෝඩකම් ගැලැවිලා බිඳිලා යනවා.

ඉතින් අන්න ඒ නිසා පින්වතුනි, මේ අවිද්‍යාව කියන එක තියෙන තාක් කල් අපට ඕනේ තරම් කර්ම රැස්වෙන්න පුළුවන්. ඕනේ තරම් දුක් උපදවන්න පුළුවන්. ඉතින් අන්න ඒ නිසා ඒ දුක නැතිකරගන්න නම් යම් දවසක මේ අවිද්‍යාව තේරුම්අරගෙන ඒකෙන් මිදිලා ප්‍රඥාවබවට හරවාගන්න ඕනේ කාරනා අපි හොඳට වටහාගන්න ඕනෙ.

ඒ නිසා තවත් උපමාවක් වශයෙන් අපි කිව්වොත් කුඩා දරුවකුගේ මේ නො දන්නාකම නිසා ඒ කුඩා දරුවාට ඕනෑ දෙයක් එයා කරනවා. අශුචි තවරාගන්නවා. කැරපොත්තන් පණුවන්, මේවාත් කටට දාගන්නවා, ගින්දරත් අල්ලනවා, ඒ වාගේ ම අනර්ථය ගෙනැත් දෙන කටයුතු ත් කරනවා. සමහරවිට, සිප්පිකටු, වළංකටු මේවාත් ගිලලා උගුරේ හිරකරගන්නවා. මේ වාගේ නොයෙක් දේවල් කරනවා වාගේ, ලෝක සත්ත්වයාත් අවිද්‍යාව නිසා මුලාවෙන් මුලාවට පත්වෙලා පැටැලිලා, ***අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා,*** කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරේ දේවතා සංයුක්තයේ, අවුලෙන් අවුලට පත්වෙලා පැටැලිලා ඔහේ යන බව දේශනා කළා.

ඒ නිසා අපි ගිය සැරේ මේ අවිද්‍යාව කියන එක කතා කරළා, පොඩි කොටසක් අපි කතාකරන්න තිබ්බා. අවිද්‍යාව බුදුරජාණන් වහන්සේ සූත්‍ර ක්‍රමයට බොහෝ තැන්වල අපට දකින්න ලැබෙන්නේ සතර කාරණයක් පිළිබඳව නො දන්නාකම කියන එක යි. ඒ තමයි, ***දුක්ඛෙ අඤ්ඤාණං, සමුදයෙ අඤ්ඤාණං, නිරොධෙ අඤ්ඤාණං, මග්ගෙ අඤ්ඤාණං*** කියන මේ කාරණා හතර පිළිබඳව නො දන්නාකම කියන එක. නමුත් තවත්, **පිටකොපදේසය, නෙත්තිප්පකරණය,** මේ වාගේ තැන් ගත්තහම ඒ වාගේ ම **ධම්මසඞ්ගණීප්‍රකරණය, විභඞ්ගප්‍රකරණය** ගත්තහම මේ තැන්වල අපට පටිච්චසමුප්පාදයේ අවිද්‍යාව කියන එක කාරණා අටකින් පෙන්නලා තියෙනවා. ඒ තමයි අපි කතා කරේ අවිද්‍යාව කියන එක සකරාකාර දුක්ඛෙ අඤ්ඤාණං, සමුදයෙ අඤ්ඤාණං, නිරොධෙ අඤ්ඤාණං, මග්ගෙ අඤ්ඤාණං කියලා, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ අඤ්ඤාණං, පුබ්බන්ත-අපරන්තෙ අඤ්ඤානං,

පටිච්චසමුප්පාද ධම්මෙසු අඤ්ඤානං තවත් හතර කාරණයක් පිළිබඳව ම පෙන්නනවා. ඒක ඔබට මම පෙන්නන්නම්, මේ තියෙන්නේ ධම්මසඞ්ගණියේ අවිජ්ජාව, මෝහය කියන එක හඳුන්වලා තියෙන ආකාරය යි. ***දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියාපටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං. යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසංගාහනා අපරියොගාහනා අසම්පෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං අයං වුච්චති මොහො. ඉමෙ තයො අකුසලහෙතූ.*** කියලා මේ ධම්මසඞ්ගනී තිකමාතිකාව යටතේ අට්ඨකතා කාණ්ඩයේ නික්ඛෙපකාණ්ඩයේ මේ දෙකේ ම සඳහන් වෙනවා. ඒ වාගේ ම තවත් මේක පිළිබඳව විභඞ්ගයේ සඳහන්වෙනවා. පෙඨකොපදේසයේ, නෙත්තිප්පකරණය ආදී බොහෝ තැන්වලත් මේ අටකාරණයක් පිළිබඳව නොදන්නා කාරණයක් ගැන සඳහන්.

එතකොට එහිදී මේකේ අපි මතුකරගන්න ඕන වටිනා කාරණා ටිකක් තියෙනවා. ඒක නිසායි මේ අවිද්‍යාවට සම්බන්ධකරලා මම මේක ආපසු ගත්තේ. අර මුල් හතරේ නො දන්නාකම කියන එක අපි ගිය සතියේ, ගියවර යම් ප්‍රමාණයකින් කතා කරා. ඔබ ඒක තවත් තේරුම්ගන්න උත්සාහවත්වෙන්න ඕන.

දුක නො දැනීම කියන්නේ අපි දන්නා ආකාරයට පිළිබඳව නොවෙයි. සමුදය නො දැනීම කියලා කියන්නේ අපි දන්නවා නේ, ඒ බවත් නො දන්නාකම නෙවෙයි කියන එක අපි කතා කරා. පරමාර්ථ ධර්මයන්ගෙන් සිද්ධවෙන මේ ක්‍රියාදාමය පිළිබඳව නො දන්නාකම කියන එක ඔබට අපි පහදලා දුන්නා.

ඒ වාගේ ම තවත් වැදගත් මොකද, අප තුළ බොහෝ කෙලෙස් උපදින්න පුළුවන් කාරණා තමයි මේ අවසාන හතර පේරුව. ***පුබ්බන්තෙ කංඛති,*** පෙර, අතීත අද්ධය කියලා මේ අට්ඨකතාවේ පෙන්නනවා. ***අපරන්තෙ කංඛති*** අපරන්ත කියලා කියන්නේ අනාගතය අද්ධය, කාලය පිළිබඳව. අනාගත කාලය පිළිබඳව කෙනෙකුට මුලාව උපදින්න පුළුවන්. ඒ වාගේ ම ***පුබ්බන්තාපරන්තෙ කංඛති,*** මේ දෙක පිළිබඳව ම මුලාව උපදින්න පුළුවන්. ***ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කංඛති.*** ඒ වාගේ ම මේ පටිච්චසමුප්පාද, මේ ප්‍රත්‍යයෙන් හටගන්නා බව, හේතු ප්‍රත්‍යයෙන් මේ සියලු ධර්මයෝ මේ ලෝකයේ හටගන්නවා කියන එක පිළිබඳව මුලාවෙන්න පුළුවන්. මුලාවෙන්න පුළුවන් කියන්නේ, මුලාවෙලා තමයි අපි බොහෝවිට ඉන්නේ.

එතකොට එහෙම ගත්තහම මේ අතීත කාලය පිළිබඳව අපි විවිධ ආකාරයෙන් බොහෝ කෙලෙස් ඇතිකරගන්නවා. එකක් අතීතය ඇතිබවට අපි ගන්නවා. අනාගතය ඇතිබවට ගන්නවා. මේ දෙක ම ඇතිබවට අපි අරගෙන බොහෝ සේ කටයුතු කරනවා. විශේෂයෙන් මේ අපි මේ අන්ත දෙක තුළ තමයි බොහෝ සෙයින් හැසිරෙන්නේ. වර්තමානයෙත් අපි නුවණින් ඉන්නේ නැහැ. බොහෝසෙයින් අපි වර්තමාණයෙත්

මුළාවෙනවා. ඒ වාගේ ම අපි මේ ප්‍රත්‍යයෙන් හටගත්ත බව, නො දන්නාකම නිසා අසවලා කරා, මා විසින් කරා මේ විදියට අපි සලකනවා. අසවල් කෙනා කරපු දේ හින්දා තමයි මට මේ දුක ආවේ. ඒ වාගේ ම සමහරවිට අපි යම් යම් භෞතික දේවල් මේවා කරගෙන ඒ දේවල්වල සැප තියෙනවා, සමහරවිට අපි කෑම බීම ගත්තහම ඒ වාගෙන් මේ සතුට, සැප එනවා කියලා ආදී වශයෙන් රසය සම්බන්ධකරගෙන. මේ විදියට මේ ඇතිබවින් අපි බොහෝ සෙයින් මුලාවෙන්නේ මේ හේතු-ප්‍රත්‍ය සමවායය නොදන්නාකම නිසා යි. ප්‍රත්‍යයෙන් හටගන්නා බව නො දන්නාකම නිසා යි.

ඒ වාගේ ම සමහර අය අතීත කාලයේ මම හිටියා ද? කවුරු වෙලා ඉන්න ඇද්ද? කොහොම ඉන්න ඇද්ද? කවරෙක්ව ඉන්න ඇද්ද? ඒ ආදී වශයෙන් සැකත් උපදිනවා. අනාගතය පිළිබඳවත් ඒ වාගේ සැක උපදිනවා. වර්තමාණය පිළිබඳවත් තමන් පිළිබඳව මේ විදියේ පසළොස් ආකාර සැකයක්, විචිකිච්ඡා උපදින බව, මේ කංඛාවිතරණය පිළිබඳව අපි විග්‍රහකරගන්න කොට ඒවා කතාවෙනවා.

ඒ නිසා මේ හේතු-ඵලදහම දැකීමෙන්, මේ ධම්මනියාමතාවය දැකීමෙන් මේ සියලු සැක සංකා, මේ අන්ත දුරුවෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරා. එතකොට මේ සියලු අන්ත ඇතිබව, නැතිබව මේ සියලු දේ පදනම් වෙලා තියෙන්නේ මේ ස්කන්ධ-ධාතු-ආයතන පිළිබඳව නොදන්නාකම, අතීතයේත් හටගත්තේ මෙබඳු ස්කන්ධ ටිකක් නේ ද, ඒ ස්කන්ධයෝ එතැන ම හටගෙන නිරුද්ධවෙනවා කියන ප්‍රඥාව අප තුළ නැහැ. අපි කාලයක් හුරුකරේ

ඉන්නවා, තියෙනවා කියන ඒ මුලාව යි හුරුකරලා තියෙන්නේ. අනාගතය පිළිබඳවත් එහෙමයි.

දැන් අපි බොහෝවිට මේ වර්තමාණයේ කොයි තරම් දුක් විඳිනවාද අනාගත බලාපොරොත්තු තියාගෙන. හැම වෙලාවේ ම අපි රෑ-දාවල් දෙකේ ම රක්‍ෂාවන් කරනවා, නොයෙක් අමතර රක්‍ෂාවන් කරනවා, ගොවිතැන්බත් කරාවි, නොයෙක් දේවල්. අපි එකතු කරන්නේ රැස්කරන්නේ මේ එකතුකරළා තියාගන්නේ ඔක්කෝම මේ අනාගතයේ සැප විඳින්න යි. වර්තමාණයේ අපි කොච්චර දුක් විඳිනවා ද, අනාගත සැපක් වෙනුවෙන්. නමුත් අපි දන්නේ නැහැ, ඒ අනාගතය කවදා හරි වර්තමාණයකට ආව දවසකට එතැන අපට අපි සිතන ආකාරයේ සැපයක් නෑ. ඒ වාගේ ම අපි අනාගතයේ සැපෙන් ඉන්න පුළුවන් කියලා වර්තමානයේ දුක් විඳ විඳ, හැමදාම අපි ඒ දුකේ යි ඉන්නේ. අනාගතය පැමිණියා කියලා එයා මේකේ සතුටට පත්වෙන්නේවත්, දුකෙන් මිදෙන්නේවත් නැහැ. හැමදාම දුක් විඳ විඳ අනාගතයට කට අයාගෙන අපි කටයුතු කරන්නේ මේ අනාගතය පිළිබඳව තියෙන අදශ්‍ර්ශනයෙන්. නොදන්නාකම නිසා යි.

මම මේවා මතුකරන්න හේතුව, අපගේ ජීවිතය තුළ එන කෙලෙස් නැතිකරගන්න මේවා තේරුම්ගත්තහම හරි පහසුයි. අපට ඒ අන්ත තුළින් එන දුක් නැතිකරගන්න. මොකද මේ හැම දුකකට ම මේ අන්ත පදනම් වෙලා තමයි එන්නේ. ඇතිබව හෝ නැතිබව, එක්කෝ අපි ඉන්නවා, තියෙනවා කියලා, එක්කෝ අතීත කාලය පිළිබඳව අපි සිහි කර කර දුක් විඳිනවා. අනාගතය පිළිබඳව ප්‍රාර්ථනා කර කර අපි කටයුතු කරනවා.

හැබැයි හොඳට මේ ධර්මයන් දිහා බලන්න, මේ කිසි දෙයක් විද්‍යාමාන නැහැ. බුදුරජාණන් වහන්සේ අතීතය අනුව යන්න එපා කියලා දේශනා කළේ ඇයි? ***යදතීතං පහීනං.*** අතීතය ප්‍රහීණවෙලා. ඒක දැන් නැහැ. නමුත් නැති අතීතයක්, අතීතය කියලා සම්මුතියක් තියෙනවා. නමුත් නැති ධර්ම ටිකක් අපි ඇතිබවට අවිද්‍යාවෙන් උපද්දවාගෙනයි. හොඳට වටහාගන්න. නැත්තා වූ ම දේවල් ටිකක් ඇතිබවට මනසින් හදාගෙන යි ඉන්නේ.

යම් දවසක විද්‍යාව උපදවාගත්තහම අර ඇතිබවට ගත්තු සියලු කෙලෙස් දුක් සියල්ල නැතිවෙන්නේ මේක අපගේ සන්තානයේ ම යෙදිච්චි කෙලේසයක් නිසායි. මේ අප ම හදාගත්තු එකක් නිසා යි. ඇත්තට ම අතීතයේ එහෙම දේවල් තියෙනවා නම්, තිබුණා නම්, අපට විද්‍යාව උපදවාගත්තා කියලා ඒකෙන් මිදෙන්න බැහැ. නමුත් යම් වෙලාවක අප තුළ ප්‍රඥාව ඉපදුනායින් පස්සේ ඒ සියලු දේවල් නැතිවෙන්නේ පින්වතුනි, මේක අපේ හිතේ ම මායාවක් නිසා යි, හිතේ ම යෙදිච්චි දෙයක් නිසා යි, එහෙම දේවල් නො තිබෙන නිසායි.

ඉතින් අන්න ඒ නිසා අපි මේ කාරණා පිළිබඳව හොඳට වටහාගත්තොත්, මේ මෝඩකම කියලා කියන්නේ අප තුළ ම මේ අන්ත යෙදෙන බව යි, මේ විදියට මුලාව යෙදෙන බව යි කියන එක අපි තේරුම් ගත්තොත්, අන්න එදාට මේ වා එනකොට ඒවාට අපි අහුවෙන්නේ නැහැ. මුලාවට පත්වෙන්නේ නැහැ. ඉතින් අන්න ඒ නිසා මේ අන්ත පිළිබඳව අපි හොඳට තේරුම්ගන්න ඕන. ඒක නිරුද්ධවෙලා. එතැන තිබුණානම් තිබුනේ කෙනෙක්-පුද්ගලයෙක් නෙවෙයි. මේ ප්‍රත්‍යයෙන් හටගෙන නිරුද්ධවෙන බවකුයි, කියලා මේ

පටිච්චසමුප්පාදය පිළිබඳව අපට වැටැහෙන්නේ නැහැ. ඒක කොයි තරම් මෝඩකමක් ද පින්වතුනි.

උදාහරණයක් වශයෙන් අපි ගත්තොත්, යම් ද්‍රව්‍ය දෙකක් අතුල්ලන කොට උණුසුමක් උපදිනවා නම්, යම් ද්‍රව්‍ය දෙකක් ගැටෙන කොට ශබ්දයක් හටගන්නවා නම්, මේ ශබ්දය පිළිබඳව කෙනෙක් මේ උණුසුම, මේ ද්‍රව්‍ය කාරණා දෙකට අයිතියි කියලා අපි කිව්වොත් ඒක මොන තරම් මෝඩකමක් ද? නමුත් ඒ කාරණාවම යි අපි කරන්නේ. යම් සැපක් එනකොට ඒ සැපය මේ කරුණු කාරණා රාශියක් නිසා මේ මොහොතේ ඉපදිච්ච එකක්. යම් දුකක් උපදිනවා නම් එහෙම යි.

අපි කියමුකො කවුරුහරි මොනවාහරි කෙනෙකුගේ ක්‍රියාවක් නිසා අපට දුකක් ආවා නම් ඒ දුක කෙලින් ම ඒ බාහිර ආරම්මණයට අපි ගැටගහන්නේ, හරියට අන්න අර වාගෙ යි. ඒ උණුසුම කියන එක, ශබ්දය කියන එක අපි අර ද්‍රව්‍යයට ගැටගැහුවා වාගෙ යි. ද්‍රව්‍ය දෙක අතුල්ලනකොට ඒ මොහොතේ නම් උණුසුම ආවේ, මේ උණුසුම කියන එක අවකාශයටවත්, එහෙම නැතිනම් මේ ගල්කැට දෙකටවත්, අයිති නැති දෙයක්. ඒ දෙක නිසා ම ඒ මොහොතේ ම පහලවෙලා ඒ දෙක වෙන්වෙන කොට ම ඒ උණුසුම නිරුද්ධවෙන ධර්මතාවයක් තියෙනවා. මේ පටිච්චසමුප්පන්න බව තේරෙන්නේ නැහැ. ඒක කියලා දුන්නත් ඔබ සැක කරනවා. අන්න ඒකයි ***ඉධ පටිච්චසමුප්පාදෙසු කංඛති*** කියලා කියන්නේ, මේ පටිච්චසමුප්පාද ධර්මය කෙරෙහි සැකකරනවා. ඒ සැක කරන්නේ අප තුළ ඇති මෝඩකම නිසා යි.

අපි එහෙම හිතුවත් පින්වතුනි, යථාර්ථය නුවණින් මේක බැසගත්තොත්, කෙනෙකුට ඒක ඇත්ත යි කියන එක තමන්ට ම වැටැහෙනවා. තමන්ට ම තේරෙනවා. එදාට ඒක පිළිබඳව කවුරු හරි එහෙම නෙවෙයි කියලා කිව්වත් එයා ඒක පිළිගන්නේ නැහැ. ඇයි? ඒක එයා අවබෝධකරගත්ත දෙයක්. ඉතින් ඒ නිසා මේක කෙනෙක් ඇතිකරපු එකක් නෙවෙයි. මේ දුක කෙනෙක්ගෙන් ආපු එකක් නෙවෙයි කියන කාරණාව එයා වටහාගත්ත දවසට කවදාවත් එයා මේ දඬු මුගුරු අරගෙන, නපුරු වචන කියාගෙන එයා මේ කෙලෙස් ඇතිකරගෙන අවුල් ඇතිකරගන්නේ නැහැ. බොහෝම ලස්සනට තමන්ගේ ගිහි ජීවිතය වුණත් ගතකරන්න පුළුවන්.

ඒ නිසා මේ අන්ත කියන ඒවා, මේ ඔක්කෝම අන්ත හැටියටයි පෙන්නන්නේ. ඒ නිසා ඒ අවිද්‍යාව කියන එක ප්‍රත්‍යවෙලා මේ විදියට මේ මුලාවන් අටකාරණයක් පිළිබඳව මුලාව ඇතිවෙනබව තමයි පෙන්නන්න ඕන.

මේකට අදාල වටිනා සූත්‍රයක් තියෙනවා. මම හැම වෙලාවේ ම පටිච්චසමුප්පාදය දේශනාකරගෙන යන කොට පටිච්චසමුප්පාද ධර්මයන් පිළිබඳව දේශනා කරළා තියෙන සූත්‍ර එකක් එකක් හරි කමක් නැහැ, මතුකරගෙන අපි ඒවාත් එක්ක කතාකරගෙන යන්න උත්සාහවත් වෙනවා. එතකොට අපට ඒ ක්‍රමාණුකූලව පටිච්චසමුප්පාදය පිළිබඳව බුදුරජාණන් වහන්සේගේ දේශනාත් මතුකර කර ම ගියා වෙනවා. ඊට අදාල යමක් ගත්තොත්, අමුතුවෙන් අපිට වෙන සූත්‍ර අරගෙන කතාකරන්න අවශ්‍ය නැහැ.

මේ ආධුනික අයටත්, ඒ වාගේ ම හැමෝට ම මේක වටිනා සූත්‍රයක්. විශේෂයෙන් බණභාවනා කරන අපි වෙනුවෙන්

ඍජුව ම පෙන්නලා තියෙන සූත්‍රයක් මේක. බොහෝ අය අහලා ඇති **කච්චානගොත්ත සූත්‍රය**[1] කියන එක. මේක සංයුත්ත නිකායේ තියෙන්නේ මේ සූත්‍රය. ඔබට බලන්න පුළුවන්. මේකේ වටිනා දහම් කාරණා ටිකක් පෙන්නනවා. මේකේ පටන්ගැනීමෙන් මේකේ වටිනාකම දැන් තේරෙන්නේ.

***අථ ඛො ආයස්මා කච්චානගොත්තො යෙන භගවා තෙනුපසඞ්කමි.*** ඉක්බිති මේ කච්චානගොත්ත කියන ස්වාමීන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගාවට පැමිණිළා ***උපසඞ්ඛමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.*** එකත්පසෙක හිටගෙන ***එකමන්තං නිසින්නො ඛො ආයස්මා කච්චානගොත්තො භගවන්තං එතදවොච:*** ඒ විදියට එකත්පසෙක හිටපු කච්චානගොත්ත ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේට මේ විදියට කිව්වා. ***"සම්මාදිට්ඨි සම්මාදිට්ඨි"ති භන්තෙ වුච්චති. කිත්තාවතානු ඛො භන්තෙ සම්මාදිට්ඨි හොතීති?*** ස්වාමීනි මේ සම්මාදිට්ඨිය, සම්මාදිට්ඨිය කියලා කියනවා ඇත්ත දැකීම ඇත්ත දැකීම කියලා කියනවා කෙතෙකින් සම්මාදිට්ඨිය වෙනවා ද? කියලා අහනවා. සම්මාදිට්ඨිය කෙනෙක් ලැබුවා කියලා කියනවානම් තමන් සම්මාදිට්ඨියට පත්වුණා කියලා කියනවානම්, කෙතෙකින් ද කෙනෙක් සම්මාදිට්ඨියට පත්වුණා කියලා කියන්නේ? මොකක් ද සම්මාදිට්ටිය යි කියලා කියන්නේ? ඇත්ත දැකීම. ඇත්ත වටහාගතයුතු යි. මම නම් සම්මාදිට්ඨියට පත්වුණා කියලා කියන කෙනා මොන පදනමකින් ද කියන්නේ? හරි වටිනා ප්‍රශ්නයක්. මේ අහන්නේ.

[1] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය 2 – 28වැනි පිටුව.

බුදුරජාණන් වහන්සේ හරි ලස්සනට, මේ සම්මාදිට්ඨිය පිළිබඳව විග්‍රහකරළා දෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ***ද්වයංනිස්සිතො ඛො'යං කච්චාන ලොකො යෙභුය්‍යෙන.*** කච්චාන, මේ ලෝකයා බෙහෙවින් අන්ත දෙකක් ඇසුරු කරනවා. ***අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච*** ඇත කියන අන්තය හා නැත කියන අන්තය යි. අන්න අපි ඉස්සෙල්ලා කතාකරේ ඔන්න ඔය අන්ත පිළිබඳව යි. ඇත හා නැත කියන අන්ත දෙක තමයි මේ ලෝකයා බෙහෙවින් ඇසුරු කරන්නේ. කටයුතු කරන්නේ. ඒකම තමයි අපි අර අතීතය පිළිබඳව, අතිතයේ හිටියා, අතීතයේ හා අනාගතය පිළිබඳව, මේ ඔක්කෝම අයිතිවෙනවා මේ ඇත හා නැත කියන අන්ත දෙකට. එතකොට අපි හැමෝම මේ අන්ත දෙකේ ඉන්නා බව බුදුරජාණන් වහන්සේ පෙන්නලා, ***ලොකසමුදයඤ්ච ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා, සා න හොති. ලොකනිරොධං ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා, සා න හොති.*** යම්කිසි කෙනෙක් ලෝකයේ හටගැනීම් ***සම්මප්පඤ්ඤාය පස්සතො*** මනා නුවණින් දැක්කොත් ***යා ලොකෙ***, ලෝකයා නැහැ කියන දෘෂ්ඨියක් තියෙනවා. නැහැ කියලා යමක් කෙනෙක් ගාව හිතාගෙන ඉන්නවා නම්, ඒ නැත කියන අන්තය නෙවෙයි. ඒ නැත කියන නැතිබව නැහැ කියන එක දුරුවෙන්නේ කුමක් නිසා ද? ලෝකයේ හටගැනීම දැක්කොත්.

මේ ලෝකයේ හටගැනීම දකිනවා කියලා කියන්නේ මේ ලෝකය ලෝකය කියලා කිව්වේ අපි කතාකරන මේ අපි දන්නා ලෝකය ගැන නොවෙයි. ස්කන්ධ, ධාතු, ආයතන. ස්කන්ධ ලෝකයේ, ආයතන ලෝකයේ, පඤ්චඋපාදානස්කන්ධලෝකය කියලා අපි එක වචනයකින්

පැටලෙන්නේ නැතුව ඉන්න කියලා කිව්වොත් එතකොට මෙන්න මේ පඤ්චඋපාදානස්කන්ධයකගේ හටගත්තා කියලා කෙනෙක් දැක්කොත්, එයා මේ හටගැනීම දකිනවා නම්, ලෝකයේ ස්කන්ධයන්ගේ නැවැත, නැවැත හටගන්නා බව දන්නවානම්,  නැහැ කියලා කියන්නේ නැහැ. ඒ කියන්නේ පින්වතුනි, දැන් අපි තියෙනවා කියන අන්ත දෙක දන්නේ නැහැ මෙන්න මේ වාගේ තැනකින්. දැන් අපි යමක් හටගෙන නැතිවුණහම අපි නෑ කියලා කියනවා. ඒ කතාව හරි. දැන් අපේ ඉදිරියේ දී ශබ්දයක් හටගත්තා නම්, ඒක නැතිවුණානම් අපි එතැන නැහැ කියලා කියනවා. අපට ඔලුවේ කැක්කුමක් හැදිලා හොඳ වුණහම ඔලුවේ කැක්කුම දැන් නැහැ කියලා කියනවා. කුසගින්න ඇතිවෙලා, කුසගින්න නිවුනහම අපි නැහැ කියලා කියනවා. එහෙම නැතිබවක් ලෝක සම්මුතියේ තියෙනවා. ඒක හරි.

නමුත් ඒක පදනම්වෙලා ලෝකයා කෙලෙස් ඇතිකරගන්නවා. අපි ඒකෙන් බේරිලා ඉන්නේ. නමුත් ඒ හටගන්නා දේ නැතිවුණා කියලා ඒ ධර්මයෝ නැවැත නැවැත උපදිනවා නම් හේතු ඇතිකල්හි ඒවා හටගන්නවා නම්, ඒකට අපට නෑ කියන්න පුළුවන් ද? අපට ඒක නෑ කියලා බේරෙන්න බැහැ.

උදාහරණයක් වශයෙන් දැන් මට ලෙඩක් නැහැ කියලා, මම නම් ලෙඩෙන් මිදිලා ඉන්නේ කියලා අපිට කියන්න පුළුවන් ද? බැහැ. හේතු ඇති කල්හි නැවැත ලෙඩවීම එන්න පුළුවන්. දැන් මට කුසගින්න නැහැ කියලා, දැන් මම බඩගින්නෙන් මිදුනා කියලා කියන්න පුළුවන් ද? බැහැ. නැවැතත් ඒ කුසගින්න හටගන්න නිසා, එහෙම අපට පුළුවන්කමක් නැහැ. මම සතර අපායයෙන් මිදුණා කියලා මට කියන්න බැහැ. දැන් මම මනුෂ්‍ය ලෝකයේ ඉන්නේ. සතර අපායයේ

නො වැටුණා කියලා මට ඒකෙන් මිදෙන්න බැහැ. ඒ නිසා යි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ කෙලෙස් ධර්ම, කර්ම කෙලෙස් තියෙන තාක් කල්, ලෝකයා සියලු දුකෙන් යුක්ත යි. අද මම ආනන්තරිය පාපකර්ම නො වුණා කියලා, අද මගෙන් අම්මා තාත්තා නො මැරුණා කියලා, මම ඒ ආනන්තරිය පාපකර්මවලින් මිදිලා නැහැ. තිරිසන් අපායට වැටෙන එකෙන් මම මිදිලා නැහැ. ඇයි? කෙලෙස්ධර්ම ටික ඇත්තේ නම්, යම් වෙලාවක ඒ කෙලෙස් ධර්ම ක්‍රියාත්මක වෙන්න පුළුවන් බව තියෙනවා නම්, ඒ කෙලෙස්වලින් කවදාහරි ඒ දුක උපද්දවන බව තියෙනවා. එහෙම දුකක් උපද්දවනවා කියන කාරණාව වෙන්න පුළුවන්.

ඉතින් අන්න ඒ නිසා මේ සාසනයේ අර අපි ඒ මොහොතට හටගෙන නැතිවුණා කියලා නැහැ කියන්නේ නැහැ. මේ සාසනයේ නැහැ කියන එකක් කියනවා. ඒ කියන්නේ හේතු නිරෝධයෙන් ඵල නිරුද්ධවුණා නම් අන්න එදාට අපට සියල්ල නිරුද්ධවුණා, ඒකෙන් මිදුනා කියලා අපට කියන්න පුළුවන්. ඒ නිසා අපට සතර අපායෙන් මිදුනා කියලා කියන්න පුළුවන්වෙන්නේ, ඊට අදාල කෙලෙස්ධර්ම ටික, සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසාදී තුන් සංයෝජනයන්, කෙනෙක්ගේ මේ කෙලෙස් ටික, නැතිවුනා නම් අන්න එදාට ඔහු සතර අපායෙන් මිදුනා කියලා කියන්න පුළුවන්.

ඒ නිසා නැවැත නැවැත උපදිනවා නම්, ඒ වාගේ හැම එකක් ම කොයි දේ ගත්තත් අපට මේ නැහැ කියන දේ ගන්න එපා. ඒක ගන්න බැහැ. අපි සම්මුතියෙන් මේ ගත්තාට ඒක හුදු බාල ධර්මයක්. අපට යමක් හටගෙන නැතිවුණා කියලා මේ

ලෞකික සම්මුතියේ, එතැනින් අපට මිදෙන්න පුළුවන්කමක් නැහැ.

ඉතින් ඒ නිසා මෙන්න මේ කතාව ලෝකයා කියන්නේ ඇයි? මේ හටගැණීම කියන එක දන්නවා. දැන් අපි ශබ්දයක්, ලී කැලි දෙකක්, වස්තු දෙකක් ගැටෙනකොට ශබ්දය හටගෙන, දැන් ඒක ගසන්නේ නැතුව හිටියාම ශබ්දය නෑ කියලා කියනවා නම් ඒක හුදු බාල ධර්මයක්. ඇයි එයාට ආපහු ඒ දෙක වද්දලා පෙන්නන්න පුළුවන්, මේ තියෙන්නේ ශබ්දය කියලා. එතකොට අන්න ඒ විදියට ලෝකයේ හටගැනීම දන්නවා නම් එයා මගහරින්නේ නැහැ. කෙලෙස් ටික තියෙනවා නම් දැන් මම නිදහස්වුණා කියලා අපට මන්දෝත්සාහීවෙන්නත් බැහැ.

ඒ වාගේ ම තවත් වටිනා කාරණාවක්. මේ ලෝකයා මේ තරම් මාර්ගඵලවලට මුලාවෙලා ඉන්නේ කුමක් නිසා ද? අද සෝවාන් ඵල දෙනවා, ධ්‍යාන දෙනවා, මේ වාගේ දේවල් ඇයි වෙන්නේ? තමන් තුළ කෙලෙස් උපදිනබව, තමන්ට තේරෙන්නේ නැහැ. තමන්ට තේරෙනවා නම් මේ තමන් තුළ කෙලේසයක් හටගන්නවා කියලා. එයාට සෝවාන් කියලා කිව්වා කියලා නුවණ තියෙන කෙනෙකුට ඒක පිළිගන්න බැහැ. ~~තමන්ට ම තේරෙනවා නම්~~ මේ කෙලෙස් තියෙනවා කියලා තමන්ට ම තේරෙනවා නම් තමන් නිර්වාණයට තියෙන තණ්හාව නිසා, ඒකත් නිබ්බාන තණ්හා කියලා ඒක නිසා හෝ, මාර්ගඵලවලට තණ්හාව නිසා හෝ, අපි ලෝකයේ ඉස්මතුවෙන්න ඕන නිසා හෝ ඒ ඵලය අපි අපට ම වංචාකරගෙන පිළිඅරගෙන ඉන්නවා. නමුත් කෙලෙස්වල හටගැනීම දකිනවා නම්, ඉන්නවා තියෙනවා කියන මේ බව තමන්ට තේරෙනවා නම්, හටගත්ත දේ තියෙනවා නම්, ඒ

ඇතිබවින් අපට කෙලෙස් එනවා නම්, අපි පටිච්චසමුප්පාදය දැකලා තියෙනවා. පටිච්චසමුප්පාදය  දැකලා නැතිනම්, ඔහුට සෝවාන් කියලා කියන්න බැහැ.

අන්න ඒ වගේ පින්වතුනි, මේ ලෝකයේ හටගැනීම නො දන්නාකම නිසා නොයෙක් වැරැදි දෘෂ්ඨි, අකුසලයන්, කෙලෙස්, දුක්, ඕනෑ තරම් උපදින්න පුළුවන්. ඔබට තේරෙනවා ඇති මේ නො දන්නාකම කියන මේ බව මේ අවිද්‍යාව කියන ධර්‍මය, කොයි තරම් අපි විග්‍රහකරගතයුතු ද? කොයි තරම් මේවා පිළිබඳ විමසිය යුතු ද? විමසන්න විමසන්න පින්වතුනි, නුවණ, ප්‍රඥාව තමයි පහළවෙන්නේ.

අන්න ඒ නිසා මේකේ තවත් ගැඹුරට ගැඹුරට යන්න පුළුවන්. නමුත් මම මේක එහෙම ගියොත් අපට මේ අවිද්‍යාව ම කියන කාරණාව තව බොහෝ කාලයක් කතාකරන්න වෙයි. ඉතින් ඒ නිසා ඔබට යම් යම් මනසිකාරයන්ට දොර විවරකරදීම් වශයෙන් තමයි මේ කරන්නේ.

එතකොට අපි සූත්‍රයට ආපසු යමු. ඔබට තේරෙන්න ඇති, මේ ලෝකය හටගැනීම දන්න කෙනෙක් නැහැ කියලා කියන්නේ නැහැ. එතැනින් එයා මගහැරලා යන්නේ නැහැ. මන්දෝත්සාහී වෙන්නේ නැහැ. නැවත දැන් උදාහරණයක් වශයෙන් අපි හිතමු, විදර්‍ශනාව තුළින් හරි, යම් සමාධිවලින්, බොහෝවිට විපස්සනාවෙන් නෙවෙයි. බොහෝ අය හොඳට සමාධිවුණායින් පස්සේ ඒ සමාධිය නිසා ‘දැන් මට කෙලෙස් නැහැ. මම වැඩේ කරගත්තා‘ කියලා ඔහු හිතනවා. එහෙම අපට බේරෙන්න බැහැ. ලෝකයේ කෙලෙස් හටගන්නා බව දකින කෙනා. හේතු ටික දකින කෙනා ඒවා ඊළඟට ***ලොකනිරොධං  ඛො කච්චායන  යථාභූතං සම්මප්පඤ්ඤාය***

***පස්සතො*** අන්න ඒ වචන ටික මනානුවණින් දැක්කොත් ***යා ලොකෙ අත්ථිතා සා න හොති.*** ඒ වාගේම ලෝකයේ යම් "ඇත" කියන අදහසක්, දෘෂ්ඨියක් තියෙනවා නම් ලෝකයේ නිරෝධය දකින කෙනාට ඒක වෙන්නේ නැහැ. පින්වතුනි, ස්කන්ධයන්ගේ හටගත්ත දේ නිරෝධය නො දන්නාකම නිසා අපි අතීතය ඇතිබවට අරන්, කොයි තරම් දුක් විඳිනවා ද? හොඳට මේක ප්‍රඥාවෙන් ඔබ හිතලා වටහා ගන්න. මේ නිසා අපට එන සැනැසිල්ල, මේ නිසා යටපත්වෙන මේ දුක සුලුපටු නෙවෙයි. මේ සැනැසිල්ල අපට කවදාවත් භෞතික දේවල්වලින් ගන්න බැහැ.

- ඒ නිසා මේ පිරිසිදු බුද්ධ දේශනාවට ඔබ ශ්‍රද්ධාවෙන් හිත තිබ්බොත් ශ්‍රද්ධානුසාරී ආකාරයෙන් ඔබට නිවන ස්පර්ශ කරන්න පුළුවන්.
- ඔබ මේ ධර්මතාවය දැක්කොත් ඔබට ධම්මානුසාරී ආකාරයෙන් ඔබට නිවන ස්පර්ශ කරන්න පුළුවන්කම තියෙනවා.

මේ දෙකෙන් ම ඔබේ කෙලෙස් කර මුලින් ම ගැලැවෙනවා. ඉතින් ඒ නිසා ඔබ මේ භාවනාව කියන එක මෙන්න මේ නිසා යි අපට වැදගත් වෙන්නේ. මේක අපි මේ සූත්‍රයේ ඉදිරියට කොච්චර කියෙව්වත්, ඒ අවබෝධය ගන්න බැහැ. නමුත් ඔබ මේක හොඳට තේරුම්ගත්තොත් මේ අතීතය අපට සිහිවෙලා කියපු දෙයක්, දැකපු දෙයක්, අහපු දෙයක්, රස විඳපු දෙයක්, ඒ වාගේ ම අපි හිතින් හිතපු මොනවා හරි දුකක් කනගාටුවක්. කෙනෙක් කරපු දෙයක්. මේ මොනවා හරි දේ නැවත නැවත සිහි වෙවී අපට කෙලෙස් එනවා. අපට හොඳට තේරුම්ගන්න පුළුවන් ඒක භාවනා කරන

කොට. ඒකයි මේ භාවනාවෙන් ඒවා මතුකරගන්න පුළුවන් කියලා කියන්නේ.

ආනාපානසතිය හෝ මෛත්‍රී කර්මස්ථානයක අපි හිත තියන කොට  අතීතයේ දේවල් සිහිවෙවී, සිහිවෙවී එනවා. ඒ එන ඒවාට මුලාවුණොත්, අපට කවදාවත් භාවනාවක් එන්නේ නැහැ. එතකොට අපි හිත දියුණුකරනවා කියලා කියන්නේ අතීතයේ යමක් සිහිවෙලා එන කොට ඒක දැන් නිරුද්ධ යි. ඇයි නිරුද්ධයි කියලා කියන්නේ? ධම්මනියාමතාවයක්, ධර්මතාවයක් තමයි යම් ස්කන්ධ ටිකක් යම් හේතු ටිකක් නිසා හටගත්තා නම්, ඒ හේතු ටික නැතිවෙන කොට ඒ රූප-වෙදනා-සංඥා-සංඛාර-විඥාන එතැන ම නිරුද්ධවෙනවා කියන ධර්මතාවයක්, ධම්මනියාමතාවයක්. ඒක සිද්ධියක්. ඒක තියෙනවා. ඒක එහෙම දෙයක් වෙනවා. ඉතින් ඒ නිසා අපි දැක්කා, ඇහුවා කියලා කියන මේ සියල්ල ම ඒ සමගම නිරුද්ධවෙනවා කියන මෙන්න මේ බව කෙනෙක්ට අවබෝධ වුණොත්, ඒකයි කියන්නේ ***ලොක නිරොධඤ්ච ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො*** අන්න ඒ වචන ටික මනා නුවණින් දැක්කොත් ඔහු ***යා ලොකෙ අත්ථිතා සා න හොති.*** තියෙනවා කියන දෘෂ්ඨිය කවදාවත් ගන්නේ නැහැ.

සම්මාදිට්ඨියට පත්වෙච්ච කෙනාගේ ලක්ෂණ ටිකක් මේ කියන්නේ. බුදුරජාණන් වහන්සේ ලස්සණට මේක පෙලගස්වාගෙන එනවා. මුලින් ම කිව්වා මේ ලෝකයා අන්ත දෙකකයි ඉන්නේ කියලා. ඒ කිව්වේ, සම්මාදිට්ඨිය නැති කෙනා, ඔන්න ඉදිරියට ගත්තා. සම්මාදිට්ඨිය නැතිබව කියන එක ඉදිරියට අරගෙන කොහොමද එයා අන්ධබාල පෘතග්ජනයෙක් කියලා කියන්නේ කියන එක ඉදිරියට ගත්තා.

අරගෙන  ඊට පස්සේ උන්වහන්සේ දැන් ඊට පස්සේ කිව්වා, ඔහු සම්මාදිට්ඨියෙන් යුක්තයි කියලා කියන්නේ මොන කාරණාවක් නිසා ද? අන්න අර ඇත හා නැත කියන අන්ත දෙක අයින්වුනොත්. ඒ දෙක අයින්වෙන්නේ කොහොම ද? එයා මේ ස්කන්ධයන්ගේ හටගැනීම නැතිවීම  හොඳාකාරව දන්න කෙනෙක්. එහෙම දන්න කෙනා අන්න අර අන්ත දෙක ගන්නේ නැහැ. ඔහු සම්මා දිට්ඨියෙන් යුක්ත යි. තවත් කාරණා ටිකක් තියෙනවා. ඊට පස්සේ නැවත ආපසු බුදුරජාණන් වහන්සේ මේ මුලාව, සම්මාදිට්ඨිය දෙක සංසන්දනය කරමින් මේ සූත්‍රය බුදුරජාණන් වහන්සේ කච්චායනගොත්ත ස්වාමීන් වහන්සේට මේක වටහාලා දෙන්න උත්සාහවත් වෙනවා.

ඊට පස්සේ ***උපායුපාදානාභිනිවෙසවිනිබද්ධො ඛ්වායං කච්චාන ලොකො යෙභුය්‍යෙන තඤ්ච උපායුපාදානං චෙතසො අධිට්ඨානං අභිනිවෙසානුසයං න උපෙති, න උපාදියති, නාධිට්ඨාති*** කියලා පෙන්නනවා. මේක ඔබට පෙනෙනවා ඇති. මෙන්න මේ ටික කියන්නේ ඊට පස්සේ ***උපායුපාදානාභිනිවෙසවිනිබද්ධො ඛ්වායං කච්චාන ලොකො*** - ලෝකයා මේ ***උපායුපාදානා*** කියලා කියන්නේ මේ තණ්හා දෘෂ්ඨි ආදී වශයෙන් මේවාට බැසගනිමින්, මේවා ඇඬිව ගනිමින් මේවායේ එල්ලිලා ඉන්නේ. ඒ කියන්නේ මේ රූප-ශබ්ද-ගන්ධ යන මේවා කෙරෙහි තණ්හාවෙන් දිට්ඨියෙන් මානයෙන් ඇඬිව ගනිමින්, මේවාට බැසගනිමින් තමයි ලෝකයා ඔන්න කටයුතු කරන්නේ. ඊට පස්සේ සම්මාදිට්ඨියෙන් යුක්ත කෙනා කොහොම ද ***තඤ්චායං*** - අන්න ඒ කියන ලද ***උපායුපාදානං චෙතසො*** - අන්න එබඳු වූ තණ්හා-දිට්ඨි-මාන කියන මේ අදහස්වලට පැමිණෙන්නේ නැහැ. ***අධිට්ඨානං අභිනිවෙසානුසයං න උපෙති,*** - අන්න

ඒවාට එන්නේ නැහැ. ***න උපාදියති,*** - ඒවා ඇඩිව ගන්නේ නැහැ. ***නාධිට්ඨාති*** - ඒවා අදිට්ඨානකරගෙන එන්නේ නැහැ. ඔහු කොහොම ද දකින්නේ? ***'අත්තා මෙ'ති. දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති, දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣතීති න කඞ්ඛති. න විචිකිච්ඡති. අපරපච්චයා ඤාණමෙවස්ස එත්ථ හොති. එත්තාවතා ඛො කච්චාන, සම්මාදිට්ඨී හොති.*** - ඔහු හිතන්නේ කොහොමද, යමක් පෙනෙනකොට, යමක් දකින කොට යමක් ඇහෙනකොට තමා තුළ ම දුක් වූ ස්කන්ධ ටිකක් හටගත්තා කියලා ඔහුට ම වැටැහීම එනවා. ඒකේ ඔහු කවදාවත් ***න කඞ්ඛති. න විචිකිච්ඡති. අපරපච්චයා ඤාණමෙවස්ස එත්ථ හොති. එත්තාවතා ඛො කච්චාන, සම්මාදිට්ඨී හොති.*** - ඔහුට ඒ පිළිබඳව තමාට ම නුවණ උපදිනවා. දුක්වූ ස්කන්ධ ටිකක් හටගත්තා. දුක් වූ ස්කන්ධ ටිකක් නිරුද්ධවුනා. ***දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති, දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣතීති*** - අන්න ඒ නුවණ සම්මාදිට්ඨියෙන් යුක්ත කෙනාගේ ස්වභාවය යි. එතකොට එයා ඒ කිසිවක් කුමන ආකාරයේ, ඉෂ්ඨ වූ, කාන්ත වූ ඒ රූප වෙන්න පුළුවන්. අමනාප වූ රූප වෙන්න පුළුවන්. ඒ එකක්වත් ඔහු අල්ලාගන්නේ නැහැ. සැප වේදනා, දුක් වේදනා කිසිවකට ඔහු අහුවෙන්නේ නැහැ. ඔහු භාවනාවෙන් මේවා සැපක් උපදවනවා. ඒත් ඔහු දන්නවා, මෙතැනත් සංඛත ධර්ම ටිකක් තියෙන්නේ. මේවාත් හටගෙන නැතිවෙලා යන ටිකක් තියෙන්නේ. ඒ නිසා මේවාත් දුක් කියලා කිව යුතු යි. ඒවා දුක් කියලා කියන්නේ ඇයි කුමක් නිසා ද? මේවාත් ඇතිවෙලා, නැතිවෙලා යන ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්ම නිසා සියලු සංඛත ධර්මයන්ට දුක යි කියලා කිව යුතු යි. ඒ සංඛත වූ මාර්ගයන්ට ඵලයන්ට හැර. නමුත් ඒවාට ද අපට මේ දුකයි

කියලා කියන්න පුළුවන් පරියායක් තියෙනවා, මොකද ඒවා සංඛත නිසා. නමුත් ඒ ලෞකික ධර්ම ගැන තමයි මේ කියන්නේ. ***න කඞ්ඛති. න විචිකිච්ඡති. අපරපච්චයා ඤාණමෙවස්ස එත්ථ හොති. එත්තාවතා ඛො කච්චාන, සම්මාදිට්ඨී හොති.***

එතකොට සම්මාදිට්ඨිය කියන්නේ මොකක් ද කියන එක දේශනා කරා.

ඊට පස්සේ, තවත් ඉදිරියට ලක්ෂණට බුදුරජාණන් වහන්සේ පෙන්නනවා, ***සබ්බමත්ථීති ඛො කච්චාන අයමෙකො අන්තො.*** - සියල්ල ඇතැයි කියන එක මහණෙනි, මේ එක අන්තයක්. කච්චායන මේ එක අන්තයක්. ***සබ්බං නත්ථීති අයං දුතියො අන්තො.*** - සියල්ල නැහැ කියලා කිව්වහම ඒ දෙවැනි අන්තය යි. ***එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම*** - කච්චායන, මේ අන්ත දෙකට නො පැමිණ ***මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති.*** - බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාව මේ කිසිදු අන්තයකට එන්නේ නැතුව තමයි ධර්ම දේශනා කරන්නේ. කොහොමද? ***අවිජ්ජා පච්චයා සංඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතණං,*** ආදීවශයෙන් ***එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධො සඞ්ඛාර නිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.*** කියලා අර දුකක් හටගත්තා. දුකක් නිරුද්ධවුණා කියන ධර්මතාවය කොහොම ද පෙන්නන්නේ? දුක ඇතිවුණේ කොහොම ද කියලා උන්වහන්සේ පෙන්නනවා. කවරෙක්, කවුරු විසින් ඇතිකරා නෙවෙයි. ඒවා මේ අතීතයේ තිබ්ලා

දුක් ආවා නෙවෙයි. කවුරුහරි මැව්වා නෙවෙයි. කොහොම ද වුණේ කියලා ඒවා හේතු සහිතව සකාරණව පෙන්නනවා. අවිද්‍යාව නිසා සඞ්ඛාරය, සඞ්ඛාරය නිසා විඤ්ඤාණය ඇතිවෙලා මෙන්න මේ විදියට මේ දුක් ගොඩ උපදිනවා. යම්කිසි කෙනෙක් අද ජාතියෙන්, ජරාවෙන් මරණයෙන් දුක් විඳිනවා නම්, කෙලෙස්වලින් දුක් විඳිනවා නම් ඒ සියල්ල ම සිදුවුණේ මෙන්න මෙහෙම ක්‍රියාදාමයකින් කියලා බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය පෙන්නනවා, අවිද්‍යාව නිසා සංඛාරය ඇතිවෙලා ඒවාට තණ්හා උපාදාන ඇතිකරගෙන ජාති-ජරා-මරණාදී දුක් දොම්නස් විඳිනවා.

යම් දවසක මේ දුක නිරුද්ධවුණොත් යම්කිසි කෙනෙක් මේ අවිද්‍යාව නැතිකරොත්, ඒ සියලු දුක නැතිවෙනවා. ඒ නිසා හොඳට ලස්සනට ඉන්නවා. යම් දුකක් ඇතිවෙනවා නම්, ඒ දුකට හේතුව අවිද්‍යා, සඞ්ඛාර ආදී මේ පටිච්චසමුප්පාදයේ පෙන්නලා, යම්කලෙක දුක නිරුද්ධවෙනවා නම් නිරුද්ධවියයුත්තේ ත් ඒ හේතු නිරෝධයෙන් මිසක් ඵල නිරෝධයෙන් නො වන බව බුදුරජාණන් වහන්සේ පෙන්නනවා.

හටගත්ත ඵලය, අපි හිතුවත් නැතත් ඒක නැතිවෙනවා. ඒ නිසා ඒ ඵලය අපට නිරුද්ධකරාට වැඩක් නැහැ. ඒක ආපහු හේතු ඇතිකල්හි ඇතිවෙනවා. ඒ නිසා **මේ ලෞකික ලෝකය තුළ හැම වෙලාවේ ම ඵල නිරෝධයක් ගැන මුලාවෙලා යි ඉන්නේ.** නමුත් මේ සාසනයේ, ඒ වාගේ ම වෙනත් සාසනවලත් මේ ඵල නිරෝධයකින් තමයි අහුවෙලා ඉන්නේ. නමුත් මේ සාසනයේ ඵලය නිරුද්ධවුණාට හේතුව ඇතිකල්හි නැවත උපදින්න පුළුවන් නිසා එතැනින් බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරේ නැහැ. හේතුව නැතිකිරීමෙන්

ම එලනිරුද්ධවෙනවා කියන කාරණාව බුදුරජාණන් වහන්සේ දේශනා කරා.

ඉතින් අන්න ඒ නිසා පින්වතුනි, මේ පටිච්චසමුප්පාදය තුළ සඳහන්වන මේ අවිද්‍යාව කියන කාරණාව පිළිබඳවයි අදත් අපි මේ විදියට කතා කරේ. ඉතින් එතකොට ඒ අවිද්‍යාව කියන කාරණාව අපි අදත් විග්‍රහකරගත්තේ තව දේශනා ගණනාවක් වුණත් මේක මතු කර කර කතා කරන්න පුළුවන්. එහෙමවුණොත් අපට කවදාවත් මේ පටිච්චසමුප්පාදය අවසන් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

පෙළ දහමට. පෙළ දහමේ අපි මුලින් ම මතුකරගත්තේ පටිච්චසමුප්පාදයේ අංග ටික යි. පටිච්චසමුප්පාද ධර්‍මය එළියට අරගෙන ඒක ඒ ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව කතාකරගෙන යනකොට තමයි මේ අවිද්‍යාව කියන එක ඉදිරියට අරගෙන ඒක විග්‍රහකරගත්තේ.

ඊට පස්සේ දැන් අපට තියෙන්නේ ***අවිජ්ජා පච්චයා සංඛාරා.*** අර කියන අවිද්‍යාව ප්‍රත්‍යවෙලා කොහොම ද සංඛාර ඇතිවෙන්නේ කියන කාරණාව පිළිබඳව තමයි අපට දැන් කතා කරන්න තියෙන්නේ.

එතකොට අවිජ්ජා කවරේ ද කියන එක අපි කතාකරා. ඊට පස්සේ එහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් ***තත්ථ කතමෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා:*** අන්න එතැන අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපදින සංඛාර කිව්වේ මොනවා ද? ***පුඤ්ඤාභිසඞ්ඛාරො, අපුඤ්ඤාභිසඞ්ඛාරො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො කායසඞ්ඛාරො වචීසඞ්ඛාරෙ චිත්තසඞ්ඛාරො*** කියලා පෙන්නුවා. මේ තියෙන්නේ ඒ කාරනාව යි. එතකොට මේ සඞ්ඛාරය කියන

එක බුදුරජාණන් වහන්සේ බෙදලා පෙන්නනවා හයකට. ***පුඤ්ඤාභිසඞ්ඛාරො,*** කිව්වේ මොනවා ද? කුසල් චේතනා ටික පුඤ්ඤාභිසඞ්ඛාර යි. කාමාවචර, රූපාවචර කුසල්චේතනා පුඤ්ඤාභිසඞ්ඛාර යි. අපට මේ බෙදීම නැතුව තවත් පොදු විග්‍රහයක් කරන්න පුළුවන් පුඤ්ඤාභිසඞ්ඛාර කියන එකට. තුන්භූමියේ ම තියෙන කුසල් ටික පුඤ්ඤාභිසඞ්ඛාර කියලා කියන්නත් පුළුවන්. නමුත් මෙතැන වෙනම ආනෙඤ්ජාභිසඞ්ඛාර කියලා බෙදලා තියෙන නිසා ඒක අපි කියන්නේ නැහැ. මෙතැන පුඤ්ඤාභිසඞ්ඛාර කියලා කිව්වේ කාමාවචර හා රූපාවචර කුසල චේතනා පුඤ්ඤාභිසඞ්ඛාර යි. ***අපුඤ්ඤාභිසඞ්ඛාරො,*** කියලා කියන්නේ සියලු අකුසල චේතනා අපුඤ්ඤාභිසංඛාර යි. ***ආනෙඤ්ජාභිසඞ්ඛාරො*** කියලා කිව්වහම මේකේ අදහස අට්ඨකතාවේ පෙන්නනවා රූපාවචර චතුත්ථධ්‍යාන කුසල චේතනාව හා අරූපාවචර කුසල චේතනා හතර ආනෙඤ්ජාභිසඞ්ඛාර කියලා. එතකොට මෙතැන ආනෙඤ්ජ කියලා පදයේ කියන්නේ ඒක අපට අට්ඨකතාවට ගියහම විග්‍රහකරගන්න පුළුවන්. දැනට අපි කෙටියෙන් කතාකරගත්තොත්, ආනෙඡ්ජ කියලා කියන්නේ ***ඉඤ්ජන*** කියලා කියන්නේ සෙලවෙනවා කියන එක යි. ආනෙඡ්ඣ කියලා කියන්නේ සෙලවෙන්නේ නැති. විරුද්ධ ධර්මයන්ගෙන් කම්පාවෙන්නේ නැති, සෙලවෙන්නේ නැති යම් ධර්ම ටිකක්, සංඛාර ටිකක් තියෙනවා නම්, ඒවා ආනෙඤ්ජාභිසඞ්ඛාර යි. දැන් රූපාවචර සංඛාරයන් නීවරණයන්ට ලඟයි. ඒ නිසා මේවා තුළ තවම සෙලවෙන ගතිය තියෙනවා. මොකද, කාමයට ලඟයි. අරූපාවචර සඞ්ඛාර කියලා කියන්නේ කාමයෙනුත් මිදිලා, රූපාවචරයන්ගෙනුත් මිදිලා අරූපයට ධ්‍යාන උපදවාගත්තු අය මේ නීවරණයන්ගෙන් බොහෝ ඈත්වෙලා යි ඉන්නේ. කාම සංකල්පයන්ගෙන් ඈත්වෙලා යි

ඉන්නේ. මේවායේ කාමධර්මයන්ගෙන් කවදාවත් සොලවන්න බැරි නිසා තමයි ඒවාට ආනෙඤ්ජාභිසඞ්ඛාර කියලා කියන්නේ.

එතකොට ඒක ම තවත් බෙදනවා ***කායසඞ්ඛාරෝ වචීසඞ්ඛාරෝ චිත්තසඞ්ඛාරෝ*** කියලා. එතකොට මේ කායසඞ්ඛාර වචීසඞ්ඛාර චිත්තසඞ්ඛාර කියලා වෙනම තවත් සංඛාර කොටසක් නැහැ. මේ පුඤ්ඤ අපුඤ්ඤ ආනෙඤ්ජ කියන සඞ්ඛාරයෝ ම තවත් ප්‍රබේධයක් හැටියට දැක්වුවා. මේවා පිළිබඳව ඇතැම් විවේචන තියෙනවා මේ පෙලේ තියෙන්නේ මේ පුඤ්ඤාභි අපුඤ්ඤාභි ආනෙඤ්ජාභි සංඛාර විතර යි. නමුත් ආයෙ මොකට ද මේ මෙහෙම එකක් කියන්නේ. මේ නැති දෙයක් කියලා. නැහැ ඇත්තටම මේක අභිධර්මපිටකයේ තියෙනවාය සූත්‍ර පිටකයේ නැහැ යි කියලා අපි ඒවාගෙන් තීන්දු තීරණ ගන්නේ දහම්න්‍යාය පදනම නො දන්නාකම නිසා යි. ඇත්තට ම පුඤ්ඤාභිසඞ්ඛාරය යි කියන එක යෙදෙන්න පුළුවන් කායසඞ්ඛාර, වචීසඞ්ඛාර, මනොසඞ්ඛාර කියලා. කුසල අකුසල ආනෙඤ්ජාභි කියන යම් න්‍යායකින් පෙන්නලා, ඒක සිදුවෙන ද්වාර ටිකයි පෙන්නුවේ: කායද්වාරයෙන්, වචීද්වාරයෙන් හා මනොද්වාරයෙන් කියන මේ ද්වාර හයෙන් සිද්ධ වෙන්න පුළුවන් ක්‍රමය තමයි බුදුරජාණන් වහන්සේ මේ පෙන්නුවේ. එතකොට අපි මේකෙන් විග්‍රහකරගන්නට පෙර අපි මේකේ තියෙන සඞ්ඛාරය කියන කාරණාව පිළිබඳව අපි පොඩ්ඩක් විස්තරකරගම්මු, සඞ්ඛාරය යි කියන කාරණාව.

**සඞ්ඛාර** කියන ශබ්දය ගත්තහම අපි ඒකට ඉස්සෙල්ලා පොඩි වචනයක් කියන්න ඕන මට.

බුදුරජාණන් වහන්සේගේ දේශනා තියෙනවා එක ම වචනය විවිධ අර්ථවල යෙදෙනවා. ඒක අපි මේ, විශේෂයෙන් අපි මේ පෙළදහමක් බලනකොට ඒවා හොඳාකාරව දැනගෙන තියෙන්න ඕන. එක ම වචනය විවිධ අර්ථවල තියෙනවා. ඒ නිසා ඒ වචනය යම් යම් තැන්වල තිබුණා කියලා අපි දන්නා අර්ථයට ඒ වචනය ගැලැපුවොත් මේ ධර්මය ඕනෑ කෙනෙකුට වැරැදි අර්ථ නිරූපණය කරලා තමන්නේ දෘෂ්ටිය බුද්ධ දේශනාවක් හැටියට පෙන්නන්න පුළුවන්. නමුත් එහෙන් වෙන කෘත්‍යය, අර්ථය මොකක් ද කියලා තේරුම්ගත්ත කෙනා එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා එක ම වචනය විවිධ අර්ථවල යෙදෙන්න පුළුවන්. අනික් පැත්තට එකම වචනයේ විවිධ අර්ථවලට කියනවා ඒ වාගේ ම විවිධ වචනවලින් එක ම අර්ථයක් කියනවා. කොයි තරම් වචන ගොඩක් කිව්වාට කියලා තියෙන්නේ එක ම අර්ථයක්.

අපි උදාහරණයක් වශයෙන් කිව්වොත් මුල් එකට, අපි කියමු **ස්කන්ධ** කියන එක. ස්කන්ධ කියන වචනයක් මේ ශාසනයේ තියෙනවා. ස්කන්ධ කියන එකේ අපි රූපස්කන්ධය, පංචඋපාදානස්කන්ධය කිව්වොත් එක අර්ථයක්. එහි රූපස්කන්ධය වේදනාස්කන්ධය යි කිව්වොත් තවත් අර්ථයක්. සීලස්කන්ධය කිව්වොත්, ප්‍රඥාස්කන්ධය කිව්වොත් තව අර්ථයක්. අග්ගික්ඛන්ධො, අග්ගික්ඛන්ධය කිව්වොත් එතකොට තවත් අර්ථයක්. මේ මේ විදියට දැන් ස්කන්ධ කියන එක ඒ ඒ තැන්වල යෙදෙනකොට, එක ම වචනය යි. නමුත් විවිධ අර්ථවල යෙදෙනවා.

ඒ වාගේ ම තවත් දේවල් තියෙනවා, එක ම වචනයෙන්, විවිධ වචන කියනවා නමුත් එකම අර්ථයට. බොහෝ විට සම්පූර්ණයෙන් විරුද්ධ නැහැ ඒ වචන කිව්වාට. දැන් අපි

උදාහරණයක් වශයෙන් කිව්වොත් අපි කියමුකෝ අපට ඔය මේ මෙත්ත සූත්‍ර යේ හම්බවෙන්නේ ***මෙත්තාය භික්ඛවෙ භාවිතා බහුලීකතා යානිකතා, වත්ථුකතා, අනුචිතා, පරිචිතා, සුසමාරද්ධාය*** කියලා බොහෝ වචන කිව්වා. මේ කිව්වේ පොඩි පොඩි වෙනස්කම් තියෙන්න පුළුවන්. නමුත් ***භාවිතා බහුලීකතා, යානිකතා, වත්ථුකතා*** කියලා මේ කිව්වේ බොහෝ සෙයින් මේක නැවත නැවත හුරුකිරීමෙන් භාවිතා කිරීමෙන් කියන අර්ථයෙන්. එතකොට ඒ වාගේ ම තව තියෙනවා ස්පර්ශයේ තියෙනවා ***ඵස්සො ඵුසනා යං සම්ඵුසිතත්තං*** කියලා මේ ස්පර්ශකරනබවත්, ස්පර්ශකරන අයුරත්, මේ විදියට. ඒ වාගේ ම සතිය කියන කොට ***කතමංච ආවුසො සති? යා සති අනුස්සති, පතිස්සති, සරණතා, ධාරණතා, අපිළාපණතා, අසම්මුස්සනථා,*** කියලා මේ එක ම සතිය පිළිබඳව විවිධ වචනවලින් කියනවා. වචන ගොඩක්. නමුත් එක ම අර්ථය යි තියෙන්නේ.

අතන එහෙම නැහැ. එක ම වචනයෙන් විවිධ තැන්වල පෙන්නනවා. හැබැයි විවිධ අර්ථ තියෙන්නේ. ඉතින් අන්න ඒ නිසා මේ සඞ්ඛාර ශබ්දය පිළිබඳවත් ඒ වාගේ අර්ථ තියෙනවා. ඒක අපි අට්ඨකතාවට යමු අපි ඒකෙදි අපි. බලමු පොඩ්ඩක් ඒක පිළිබඳවත්.

***යං පටිච්ච ඵලමෙති සො පච්චයො.*** අපි මේ ප්‍රතයය පිළිබඳව, දැන් ***අවිජ්ජා පච්චයා සඞ්ඛාරා*** කියන එක මෙතැන අටුවාවේ පොඩ්ඩක් පැහැදිළි කරනවා. ***යං පටිච්ච ඵලමෙති*** - යමක් ප්‍රත්‍යයෙන් ඵලයක් උපදිනවා නම් ***සො පච්චයො.*** - ඒකට ප්‍රත්‍යය කියලා කියනවා. ***පටිච්චාති න විනා තෙන;*** ප්‍රත්‍යයෙන් තොරව ඒ දේ වෙන්නේ නැහැ. කියන අර්ථයෙන් එතැන කිව්වේ. ***තං අපච්චක්ඛිත්වාති අත්ථො.*** ප්‍රත්‍යයෙන්

තොරව වෙන්නේ නැහැ කියන එක තමයි, අවිජ්ජා පච්චයා සඞ්ඛාරො කියන කොට මේ සඞ්ඛාරය අවිද්‍යා ප්‍රත්‍යයෙනුයි හටගත්තේ. එතකොට ප්‍රත්‍යය කියලා කිව්වේ අවිද්‍යාව යි. ප්‍රත්‍යඋප්පන්නය කියලා කිව්වේ සංඛාරය යි. එතකොට ***එතීති උප්පජ්ජති චෙව පවත්තති චාති අත්ථො.*** එයින් උපදී පවතී කියන බව තමයි මෙතැන ප්‍රත්‍යය. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සඞ්ඛාර වේ. අවිද්‍යාවෙන් උපදී. අවිද්‍යාව නිසා පවතී කියන අර්ථය යි. ***අපි ච උපකාරකට්ඨො පච්චයට්ඨො.*** කියලා පෙන්නනවා. ප්‍රත්‍යය කියන එක උපකාර අර්ථය හා ප්‍රත්‍ය අර්ථය කියන මේ කාරණා දෙකෙන් ම තියෙනවා. ඒ නිසා ***අවිජ්ජා ච සා පච්චයො චාති අවිජ්ජාපච්චයො. තස්මා අවිජ්ජාපච්චයා.*** කියලා ඒ විදියට තමයි ඒ අතන අපට කියපු එක අට්ඨකතාවෙන් අර්ථ දක්වලා අවිජ්ජාව ප්‍රත්‍යය වෙලා අවිජ්ජා ප්‍රත්‍යයෙන් කියන අර්ථය යි තියෙන්නේ.

ඊට පස්සේ පෙන්නනවා, අවිජ්ජා පච්චයා සංඛාරා කියලා කියන තැන ***සඞ්ඛතංඅභිසඞ්ඛරොන්තීති සඞ්ඛාරා.*** එතැන තියෙන්නේ ඔබට පෙනෙනවා ඇති. මේ කොටසයි පෙන්නන්නේ. එතකොට ***සඞ්ඛතං අභිසඞ්කරොන්තීති සඞ්ඛාරො.*** සංඛතය කියලා කිව්වේ මොනවා ද? මේ ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මයන්ට තමයි සඞ්ඛත කියලා කියන්නේ. එබඳු සංඛතය නැවැත නැවැත සකස්කරන අර්ථයෙන් තමයි සඞ්ඛාර කියලා කියන්නේ. ඒක ඔබ අහලා තියෙන කාරණාවක් සූත්‍රවල. මේකට කියනවා සංඛතය. නැවැත නැවැත සකස් කරනවා. අපට යම් ප්‍රත්‍ය යෙන් යමක් හටගත්තා නම් - උදාහරණයක් වශයෙන් අපි කියමුකො ඔන්න දැන් අපට ඇහැත්, රූපයත්, චක්ඛුවිඤ්ඤාණයත්, නිසා දැකීම වෙනවා. ඔන්න සඞ්ඛතධර්ම ටිකක් හටගත්තා. අභිසඞ්කරොන්තීති කියලා කියන්නේ මේක පිළිබඳව අපි

මුලාවෙලා. මේක පිළිබඳව අපි විවිධ අදහස් ඇතිකරගෙන මේකේ සංඛාර ඇතිකරගන්නවා. සත්ත්ව-පුද්ගලභාවයේ අදහස් ඇතිකරගන්නවා, ඒකේ ඉන්නවා, තියෙනවා කියලා ඇතිකරගන්නවා, අර සඞ්ඛත ධර්මයක්. ප්‍රත්‍යයෙන් හටගත්තු ධර්මයක්. ඒක ඇතිබවට ඔන්න චේතනාවක් ඇතිකරගත්තු නිසා ඒ දේවල් නැවැත නැවැත අපට සිහිවෙවී එනවා. එහෙම නැතිනම් ඒවා අපි නැවැත නැවැත බලනවා. ඒවා බලලා ඒවා උපද්දවාගන්නවා. අන්න ඒ නිසා තමයි සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති නැවැත නැවැත සඞ්ඛතය සකස්කරන නිසා සඞ්ඛාර කියලා කියනවා. ***අපිච අවිජ්ජා පච්චයා සඞ්ඛාරා. සඞ්ඛාර සද්දෙන ආගතසඞ්ඛාරා චාති දුවිධා සඞ්ඛාරා.*** එතකොට මේ සඞ්ඛාරය සඞ්ඛත සඞ්ඛාරය ආගත සඞ්ඛාරය කියලා දෙකෙන් ආගත සඞ්ඛාරය කියලා කිව්වේ අපි අර අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියලා කිව්වේ. එතකොට අවිද්‍යාව නිසා හටගත්තු සංඛාරය යි. ***තත්ථ පුඤ්ඤාපුඤ්ඤානෙඤ්ජාභිසඞ්ඛාරා තයො,*** මේක ඒ සඞ්ඛාරයේ පුඤ්ඤ-අපුඤ්ඤ-ආනෙඤ්ජ කියලා තුනක් ***කායවචීචිත්තසඞ්ඛාරා තයොති*** කායසඞ්ඛාර, වචීසංඛාර, චිත්තසඞ්ඛාර වශයෙන් තව තුනකට ***ඉමෙ ඡ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා තෙ සබ්බෙපි ලොකියකුසලාකුසලචෙතනාමත්තමෙව හොන්ති.*** එතකොට මේ කිව්වේ සඞ්ඛාරය කොටස් තුණකින් පෙන්නුවා අවිජ්ජා පච්චයෙන් උපදින සඞ්ඛාර, පුඤ්ඤාභි-අපුඤ්ඤාභි-ආනෙඤ්ජ. කාය-වචී-මනො කියලා සඞ්ඛාර වශයෙන්, එතකොට මේ ඔක්කෝම කිව්වේ ලෞකිකකුසලාකුසලචේතනාවන් ම පමණ යි. ඇයි එහෙම කිව්වේ? මෙතැන පෙන්නන්නේ සඞ්ඛාර තව තියෙනවා. ඒ සියලු සඞ්ඛාරවලින් මෙතැන අවිද්‍යාප්‍රත්‍යයෙන් උපදින

සංඛාර විතරයි ගන්නේ. ඒ නිසා යි මෙතැන අර විදියට බෙදුවේ.

ඊට පස්සේ අපි ආපහු යමු, ***සඞ්ඛතසඞ්ඛාරො, අභිසඞ්ඛතසඞ්ඛාරො, අභිසඞ්ඛරණසඞ්ඛාරො, පයොගාභිසඞ්ඛාරොති ඉමෙ පන චත්තාරො සඞ්ඛාරසද්දෙන ආගතසඞ්ඛාරො*** එතකොට මේ සංඛාර සද්දය හතරකට පෙන්නනවා. තව රාශියක් තියෙනවා. මෙතැන පෙන්නනවා සඞ්ඛතසඞ්ඛාර, අභිසඞ්ඛතසඞ්ඛාර, අභිසඞ්ඛරණසඞ්ඛාර, පයොගාභිසඞ්ඛාර කියලා මේ විදියට සඞ්ඛාර හතර ආකාරයකට පෙන්නනවා. ***තත්ථ*** (Myanmar .128) ***"අනිච්චා වත සඞ්ඛාරා"ති ආදීසු*** (දී.නි. 2.221, 272; සං.නි. 1.186; 2.143) දීඝනිකාය සංයුත්ත නිකාය ආදිය තියෙන තැන්වල ***වුත්තා, සබ්බෙපි සප්පච්චයා ධම්මා 'සඞ්ඛතසඞ්ඛාරා' නාම.*** එතකොට ***"අනිච්චා වත සඞ්ඛාරා"*** කියලා බුදුරජාණන් වහන්සේගේ දේශනාවක් තියෙනවා. එතැන සඞ්ඛාරය කියන එකක් පෙන්නලා තියෙනවා. ඒක ඇතුලු ප්‍රත්‍යයෙන් හටගත්තු සියලු ධර්මයෝ, ***සප්පච්චයා ධම්මා 'සඞ්ඛතසඞ්ඛාරා' නාම.*** එතකොට මේක සවිඤ්ඤාණක අවිඤ්ඤාණක රූප අරූප සියලු දේවල්වලට සඞ්ඛත සඞ්ඛාර කියලා කියනවා. මේ සඞ්ඛත සඞ්ඛාර යි.

ඊට පස්සේ ***කම්මනිබ්බත්තා තෙභූමකා රූපාරූපධම්මා 'අභිසඞ්ඛත–සඞ්ඛාරා'ති*** *අට්ඨකථාසු වුත්තා.* මේ තියෙන්නේ අභිසඞ්ඛතසඞ්ඛාරා කම්මනිබ්බත්තා තෙභූමකා - කර්මයෙන් උපද්දවාපු, කර්ම හේතුවෙන් හටගත්තු, රූපාරූපධර්ම සමූහයක් තියේ නම්, ඒවාට කියනවා අභිසඞ්ඛත සඞ්ඛාර කියලා. සකස්කරපු, කර්මයෙන් හදපු සඞ්ඛාර. එතකොට එතැන රූපාරූපධම්මා කිච්චහම එතැන රූප හැටියට ගන්නේ කර්මජ

රූපයි. මොකද ඒක කර්මයෙන් හදාපු රූප යි. තවත් රූප ධර්ම තිබුනාට එතැන ඒක බෙදලා ගන්න ඕන. එතකොට ඒවාට කියනවා අභිසඞ්ඛත සඞ්ඛාරා කියලා ඊට පස්සේ ***තෙපි "අනිච්චා වත සඞ්ඛාරා" ති එත්ථෙව සඞ්ගහං ගච්ඡන්ති.*** ඒකත් අරකේ ම සංග්‍රහ වෙනවා. ***විසුං පන තෙසං ආගතට්ඨානං න පඤ්ඤායති. තෙභූමකකුසලාකුසලචෙතනා පන 'අභිසඞ්ඛරණකසඞ්ඛාරො'ති වුච්චති.*** ඊට පස්සේ කියනවා මේ තෛභූමික - තුන්භූමිය අනුව ගියපු ***තෙභූමකකුසලාකුසලචෙතනා*** කාමාවචර, රූපාවචර, අරූපාවචර කුසලාකුසලචේතනා, කර්ම චේතනා, ***පන 'අභිසඞ්ඛරණකසඞ්ඛාරොති'ති වුච්චති.*** ඒවා අපි ඉස්සෙල්ලා කිව්වේ එහෙම කතා කරේ. එතකොට මේ අප තුළ අර කර්ම සකස්වෙන ආකාරයෙන් ඇතිවන චේතනා, පුඤ්ඤාභි- අපුඤ්ඤාභි-ආනෙඤ්ජාභි කියන තුන්භූමිය අනුව ගියපු කුසලාකුසල චේතනාවලට කියනවා, අභිසඞ්ඛරණසඞ්ඛාර කියලා. නැවත නැවත උපද්දවමින්, මේ ස්කන්ධයන් උපද්දවන සඞ්ඛාර. ***තස්ස "අවිජ්ජාගතොයං, භික්ඛවෙ, පුරිසපුග්ගලො පුඤ්ඤඤ්චෙ අභිසඞ්ඛරොති"ති ආදීසු*** (සං.නි. 2.51) ***ආගතට්ඨානං පඤ්ඤායති.*** සංයුත්ත නිකායේ සූත්‍රයේ බුදුරජාණන් වහන්සේගේ බුද්ධ දේශනාව පෙන්නන්නේ. එතැන කියන්නේ ***අවිජ්ජායගතො භික්ඛවෙ*** අවිද්‍යාවෙන් යුක්ත වූ පුද්ගලයා මහණෙනි, ***පුඤ්ඤඤ්චෙ අභිසඞ්ඛරොති"ති*** පුඤ්ඤාභිසඞ්ඛාරය ද රැස් කරයි. අපුඤ්ඤාභිසඤ්ඛාරය ද රැස්කර යි. ආනෙඤ්ජාභිසඞ්ඛාරය ද රැස්කරයි. මේ සියල්ල අවිජ්ජාවෙන් යුක්ත වූ කෙනා කියලා බුදුරජාණන් වහන්සේගේ මේ සූත්‍ර දේශනාවන්වල තියෙනවා.

ඊට අමතරව ***කායිකචෙතසිකං පන විරියං 'පයොගාභිසඞ්ඛාරො'ති වුච්චති. සො "යාවතිකා***

***අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසී“ති ආදීසු*** (අ. නි. 3.15) ***ආගතො.*** අංගුත්තර නිකායෙ සූත්‍ර පාඨයක් තියෙනවා. ඒ සූත්‍ර පාඨය පෙන්නලා බුදුරජාණන් වහන්සේ, පයොගාභිසඞ්ඛාර කියලා කියනවා. කායික වීයර්යෙන්, කායික චෛතසික වීයර්යෙන්, යුක්තව අපි ඇතිකරගන්නා සඞ්ඛාරවලට කියනවා පයොගාභිසඞ්ඛාර කියලා.

ඉතින් ඒ විතරක් නෙවෙයි ***න කෙවලඤ්ච එතෙයෙව,*** එතැනින් අවසන් වෙන්නේ නැහැ. තවත් ***අඤ්ඤෙසි "සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස ඛො, ආවුසො විසාඛ, භික්ඛුනො පඨමං නිරුජ්ඣති වචීසඞ්ඛාරො, තතො කායසඞ්ඛාරො තතො චිත්තසඞ්ඛාරො“තිආදිනා (ම.නි. 1.464)*** මජ්ඣිම නිකායේ තියෙන **වෙදල්ල සූත්‍ර යේ**[2] එහෙම සඳහන් වෙන්නේ. විශාඛ, පළමුවම වචීසඞ්ඛාර නිරුද්ධවෙනවා. චිත්තසඞ්ඛාර කායසඞ්ඛාර නිරුද්ධවෙනවා කියලා එතැන සඞ්ඛාර කාය සඞ්ඛාර වචීසඞ්ඛාර චිත්තසඞ්ඛාර කියලා ඒ විදියට මේ සඞ්ඛාරය කියන එක පෙන්නනවා. එතකොට දැන් අපට හම්බවෙනවා තව පඤ්චඋපාදානස්කන්ධය තුළ සඞ්ඛාරයක් තියෙනවා සංස්කාරස්කන්ධය කියලා. අනිච්චා වත සඞ්ඛාරා කියලා තව තැන්වල කියනවා. තව ඒ වාගේ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියලා. මේ විදියේ සඞ්ඛාරය පිළිබඳව එක ම වචනය විවිධ අර්ථවලට පෙන්නලා තියෙනවා. නමුත් මෙතැන බුදුජරාණන් වහන්සේ මේ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියලා කිව්වේ අභිසඞ්ඛරන සඞ්ඛාර ටික යි. ඒ කියන්නේ තුන්භූමිය අනුව ගියපු කුසල-අකුසල හා ආනෙඤ්ජාභි කියන මේ සඞ්ස්කාරයන් ටික තමයි අවිද්‍යා

---

2

ප්‍රත්‍යයෙන් උපදින්නේ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරා.

එතකොට ඒක තමයි මේ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියන මේ වචනයේ පදගථාර්ථය. ඒක ඔබට යම් ගැටලුවක් තියෙනවා නම් පසුව සාකච්ඡාවේ දී අහන්න පුළුවන්.

ඊට අමතරව අපි ආපසු ගියොත් සූත්‍රයට, එතකොට මේ පුඤ්ඤාභිසඞ්ඛාර, අපුඤ්ඤාභිසඞ්ඛාර, ආනෙඤ්ජාභිසඞ්කාර කියන ඒවා, මේක මම කෙටි විග්‍රහයක් කරළා නතර කරනවා. මේකේ තව විස්තර ටිකක් තියෙනවා අපට කතාකරන්න බෙදලා. අපි ඒක ඉදිරියේ දී කතා කරමු.

**පුඤ්ඤාභිසඞ්ඛාර** කියලා කිව්වේ, ධර්මයෙහි සඳහන්වන කාමාවචර කුසල චේතනා අට, දානමය, සීලමය, භාවනාමය වශයෙන් ගත්තහම කාමාවචර මහා කුසල් සිත් අටක් තියෙනවා. ඔබ අහලා ඇති. සෝමනස්ස සහගත ඥානසම්ප්‍රයුක්ත, අසංකාරික, සසංකාරික, ඥානවිප්පයුත්ත අසංඛාරික, සසංඛාරික උපෙක්‍ෂා සහගත ඥානසම්පයුක්ත සසංඛාරික අසංකාරික ආදී වශයෙන් ලෝකයේ කාමලෝකයේ ඉන්න කොයි කාටත් උපදින්න පුළුවන් කුසල් පිළිබඳව හතකට කඩලා බුදුරජාණන් වහන්සේ පෙන්නුවා, මේවා කුසල් චේතනා අට. එතකොට අභිධර්මය දන්නා අය මේක දන්නවා. ඒ ටිකයි රූපාවචර කුසල චේතනා ටිකයි, පුඤ්ඤාභිසඞ්ඛාර කියලා බුදුරජාණන් වහන්සේ අර්ථ දැක්වුවා.

**අපුඤ්ඤාභිසඞ්ඛාර** කියලා කියනවා, අකුසල චේතනා දොළහක් තියෙනවා. ලෝභ මූලයේ ලෝභය නිසා උපදින

සිත් අටක් තියෙනවා. ද්වේෂය නිසා උපදින ද්වේෂ මූල සිත් දෙකක් තියෙනවා. මෝහය නිසා උපදින, මෝහ මූල සිත් දෙකක් තියෙනවා. ඔක්කෝම දොළහ යි. එතකොට මේ සියලු ම, අකුසල සිත් දොළහ ම, අපුඤ්ඤාභිසඞ්ඛාර හැටියට ගැනෙනවා.

**ආනෙඤ්ජාභිසඞ්ඛාර** හැටියට ගැනෙන්නේ අරූපාවචර කුසල චේතනා ටික යි. ඒක යම් අදහසක් පෙන්නනවා. මේ රූපාවචර චතුත්ථජ්ඣාන කුසල චේතනාවත් ගන්න පුළුවන් බව අට්ඨකථාවේ පෙන්නනවා. නමුත් අපි සාමාන්‍යයෙන් පොදුවේ ගත්තොත් කියන්නේ අරූපාවචර කුසල චේතනා හතර, ඒ කියන්නේ ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කියන කුසල චේතනා ටික යි. ඒකේ විපාක-කිරිය-කුසල් කියලා අරූපාවචර සිත් වශයෙන් ගත්තහම දොළහක් තියෙනවා. නමුත් මෙතැන ගන්නේ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියලා කියන කර්ම ටික නේ. ඒක නිසා විපාක ක්‍රියාවල කර්ම නැහැ නේ. ඒ නිසා ඒ ටික ගන්නේ නැහැ. මෙතැන ගන්නේ කර්ම චේතනා ටික විතර යි. ඒකයි හතරක් කියලා පෙන්නුවේ. එතකොට ඒ ඔක්කෝම ආනෙඤ්ජාභිසඞ්ඛාර යි.

එතකොට මේ සංස්කාරයන්, අපි ඉදිරියේ දී විග්‍රහ කරමු, එතකොට පුඤ්ඤාභිසඞ්ඛාර, කායසඞ්ඛාර, වචීසඞ්ඛාර, චිත්තසඞ්ඛාර කියන තුනෙන් ම වෙන්න පුළුවන්. කය මුල්වෙලා පුඤ්ඤාභිසඞ්ඛාර ඇතිවෙන්න පුළුවන්. වචනය මුල්වෙලා ඇතිවෙන්න පුළුවන්. සිත මුල්වෙලා ඇතිවෙන්න පුළුවන්. ඒ ඔක්කෝම පුඤ්ඤාභිසඞ්ඛාර ඇතිවෙන්න පුළුවන්, ද්වාර තුනේ.

අපුඤ්ඤාභිසඞ්ඛාරත් ඇතිවෙන්න පුළුවන්, කායසඞ්ඛාර, වචීසඞ්ඛාර, චිත්තසඞ්ඛාර වශයෙන්, කය, සිත, වචන මුල්වෙලා. හැබැයි, ආනෙඤ්ජාභිසඞ්ඛාර මේ කායසඞ්ඛාර වචීසඞ්ඛාර කියන ද්වාර දෙකෙන් ඇතිවෙන්නේ නැහැ. චිත්තසඞ්ඛාරයෙන් විතර යි ආනෙඤ්ජාභිසඞ්ඛාර ඇතිවෙන්නේ. ඉතින් අන්න ඒ විදියට ඒකේ බෙදීමක් දතයුතු යි.

ඊට අමතරව අපි මේකේ (වෙලාව මදිවෙයි) තව සූත්‍රයක් තියෙනවා **සඤ්චේතනා සූත්‍රය**[3] කියලා. ඒක බුදුරජාණන් වහන්සේ මේ කායසඞ්ඛාර වචීසඞ්ඛාර චිත්තසඞ්ඛාර අවිද්‍යාව ඇතිකල්හි ම වෙනවා. ඒක උපදින ආකාරය පිළිබඳව පෙන්නනවා. නමුත් අපි ඒක සූත්‍රයක් අනුසාරයෙන් පෙනෙන්නේ, **සඤ්චේතනා සූත්‍රය** කියලා. ඒක අපි ඊළඟ සැරේට තබනවා. මේකේ ගැටලු හරි සමහරවිට මේ සාකච්ඡාව තුළින් යම් යම් අපට අවශ්‍ය තැනුත් මතුවෙන නිසා සාකච්ඡාවට ඉඩ තබනවා.

අද දවසේදී අපි කතා කළේ අවිද්‍යාව පිළිබඳව නැවත අපි විග්‍රහයක් කරා. නැවත සමාලෝචණයක් කරොත්: අවිද්‍යාව පිළිබඳව අට කාරණයක් පිළිබඳව කතාකරා. විශේෂයෙන් අද මතුකරේ පුබ්බන්තෙ කංඛති, අපරන්තෙ කංඛති. මේ අතීත අනාගතය පිළිබඳව සත්ත්ව-පුද්ගලභාවයෙන් ගන්නා දෘෂ්ඨි හා ඒවා ඇතිබවට හා නැතිබවට ගන්නාබව අපි කතාකරා. ඒ වාගේ ම මේ ඇත හා නැත අන්ත දෙක කොයි තරම් අපේ ජීවිතවලට බලපාමින් කෙලෙස් ඇතිවෙනවා ද කියන එක කතා කරා. ඉතින් නැහැ කියන එක මේ ලෝකයා මේ

[3] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) 378වැනි පිටුව.

දන්නේ නැහැ කියන එක තුළ අපට පිහිටන්න බැහැ. මේ නැතිවුණත් නැවත උපදින නිසා ඒ ධර්මයන්ගෙන් අපි යුක්තබව අපි තේරුම්ගන්න ඕන. ඉතින් ඒ නිසා අපිට එහෙම නැහැ කියලා බේරිලා යන්න පුළුවන්කමක් නැහැ, එයින් මිදුනාට.

ලස්සන කතාවක් තියෙනවා ඔබ අහලා ඇති මේ පිටකයේ අට්ඨකතාවේ ම, මං හිතන්නේ එන්නේ. ඒක සත්‍ය සතාවක් පිළිබඳව යි. ස්වාමීන් වහන්සේලා පිරිසක් චාරිකාවේ යන කොට, ඒ බාල ස්වාමීන් වහන්සේලා ත් හිටියා. එක්තරා පුරුෂයෙක් ඉස්සරහට හම්බවුණා. දැලි කුණු ගාගෙන, ආයුධයක් අතින් අරගෙන, එන මනුස්සයෙක් දැක්කා. ඒ මනුස්සයා දැකපු ගමන් අර පොඩිහාමුදුරුවන්ට හිනා ගියා. ඒ මනුස්සයා ඉන්න ඒ විලාසය දැකලා. ඉතින් අර හේනක මම හිතන්නේ වැඩකරළා, දැලි ගාගෙන ඇවිල්ලා තියෙන්නේ. අර මනුස්සයා එතැන නතරවෙලා, අර පොඩි ස්වාමීන් වහන්සේලාට කියනවා, 'ඔබ හිනාවෙන්න එපා ඔහොම මම දිහා බලලා. ඔබ අද ඔය සිවුරේ හිටියාට ඔබටත් මේ තත්ත්වය වෙන්න පුළුවන්'. එයා ම උපමාවට ගෙනැල්ලා කියනවා, 'ස්වාමීනි, මම මීට පෙර මේ ශාසනයේ ම පැවිදිවෙච්චි කෙනෙක්. මම මීට පෙර මේ ශාසනයේ පැවිදිවෙළා, උපසම්පදාව ලබලා, මම අභිඥා පවා උපදවාගත්තා. උඩින් ගියා. එක එක දේවල් මවලා පෙන්නන්න පුළුවන්කම තිබුණා. ඒවායේ මේ විදියට ධ්‍යාන ලබාගෙන අභිඥා ලබාගෙන හිටපු කෙනෙක්. නමුත් මේ සියල්ලන්ගෙන් ම මම පිරිහිලා අද මේ තත්ත්වයට පත්වුනා. ඉතින් ඒ නිසා මේ සිත පිළිබඳව ඔබ විශ්වාස කරන්න එපා. ඔබට ද මේක විය හැකියි. ඒ නිසා පොඩිහාමුදුරුවනේ හිනහවෙන්න එපා' කියලා මේ විදියට කියලා කිව්වා.

ඉතින් අන්න ඒ විදියට අද අපි අපට යමක් නැහැ කියලා ඒකෙන් අපව උසස්කරලා තියාගන්නත් බැහැ. යම්කිසි පුද්ගලයෙක් යම් වැරැදි තැනක ඉන්නවා කියලා ඔහු පහත් කියලා අපට කතා කරන්නත් බැහැ. මොකද, ඒ පහත් තැනට අප ද පත්වෙන්නත් පුළුවන්. තවත් අපි කතාවක් කිව්වොත් අපට මේ ද්වේශය නැතිකරවන හොඳ කතාවක් මේක. යම් කෙනෙක් වැරැද්දක් කරන කොට අපට තරහා යනවා. එතකොට ඒ පුද්ගලයා යම් වැරැද්දක් කරන්නේ යම් ධර්මයක් ඔහුගේ සන්තානයේ තියෙන නිසා නම්, අපි කියමුකෝ, වැරැද්දක් කරන්නේ එක්කෝ ඔහුගේ මෝහය හා ලෝභය මුල්වෙලා. එහෙම නැතිනම් මෝහය හා ද්වේශය මුල්වෙලා. යම් වැරැද්දක් කරනවා නම්, ඒ පුද්ගලයාට අපි දොස් කියලා, පහත්කරළා, නින්දා කරලා, බැනලා, එහෙම නැතිනම් අපි තරහත් ගන්නවා. හැබැයි ඒ ඔය වැරැද්ද ම කරන්න පුළුවන් හේතු වූ අවිද්‍යාව හා ලෝභය හා මෝහය එහෙම නැතිනම් ලෝභය හා ද්වේශය, හෝ මේ තුන ම අප තුළත් සන්තානගතව අප්‍රහීනව තියෙනවා. ඒ නිසා ඒ වැරැද්දට වඩා වැරැද්දක් සමහරවිට අප අතින් සිදුවෙන්න පුළුවන්.

අන්න ඒ නිසා අපි, ඒ ගැන හිතලා කෙනෙක් කෙරෙහි තරහක් එනවා නම් තව කෙනෙක් පහත්කරලා හිතනවා නම් ඒකෙන් අපට මිදෙන්න පුළුවන්. මොකද, ඒ ධර්මය මම ගාවත් තියෙනවා නේද, ඒ නිසා මම මේ පුද්ගලයාට දොස් කියන එක වැරැදි යි නේ ද, මේ පුද්ගලයාට මෙහෙම කියන එක වැරැදි යි නේ ද, විශේෂයෙන් අපට ස්වාමීන් වහන්සේලා සම්බන්ධවෙලා, ඒ දේවල් අපට එන්න පුළුවන්. අපි බොහෝවිට, ස්වාමීන් වහන්සේලාගේ යම් අඩුපාඩුවක් දැක්කොත් ඒවාට පුදුමාකාරයෙන් කිපිලා, දොස් කියලා, නින්දා කරනවා. හැබැයි සමහරවිට ඒ ස්වාමීන් වහන්සේලා ඒ

සිවුරු දාගත්තාට, පැවිදිවුණාට, උන්වහන්සේලා කෙලෙස් නැතිකරළා නැහැ. කාමයන්ගෙන් මිදිලා නැහැ. ඒ නිසා අඩුපාඩු වෙන්න පුළුවන්. ඉතින් ඒ නිසා තමන් ගාව ඊට වඩා අඩුපාඩු ගොන්නක් තියාගෙන අරවාගේ එක අඩුපාඩුවක් දැක්කාට අප ඒ කෙරෙහි අමනාපය, තරහාව ඇතිකරගන්නේ නැතුව, අර විදියට හිතුවොත් අපට ස්වාමීන්වහන්සේ නමක් කෙරෙහි පවා එන ඒ අකුසලය අපට නැතිකරගන්න පුළුවන්කම තියෙනවා.

මේවා පිළිබඳව අපි කතා කරමින් ඇත නැත කියන දේවල් පිළිබඳව කතා කරළා, අවිද්‍යාව පිළිබඳව, මේ අට කාරණයක් පිළිබඳව නො දන්නාකම කියන එක මනාකොට මතුකරගත්තොත් ඒකෙන් අපට මිදෙන්න පුළුවන් කියන එක මේ කච්චානගොත්ත සූත්‍රය ඉදිරියට ගෙනැල්ලා අපි කතා කරා. ඒ කිව්වේ මේ කච්චානගොත්ත සූත්‍රය ඉදිරියට අරගෙන මේ සම්මාදිට්ඨිය ඇතිවෙච්චි කෙනාගේ මානසික තත්ත්වය කොහොම ද? ඒ මානසික තත්ත්වය තිබුණොත් නොයෙක් මුලාවලට මේ ශාසනයේ ඇතිවන මාර්ගඵලලාභී මුලාවලට පවා යන්නේ නැතුව, තමන්ට ම, තමන් ම ප්‍රත්‍යවෙක්ෂාකරළා, තමන්ගේ මාර්ගඵලය තියෙනවා ද නැද්ද කියන එක හොයාගන්න පුළුවන්බව කියන එක අපි ඒ කච්චානගොත්ත සූත්‍රය ඇසුරෙන් සම්මාදිට්ඨියට පත්වුණා කියලා කියන්නේ කෙතෙකින් ද, කියන එක අපි කතාකරා.

ඊට පස්සේ අවසානයට කතාකරේ සඞ්ඛාරය කියන එක යි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සඞ්ඛාර වෙන්නේ කොහොම ද කියන එක පිළිබඳව අපි කතාකරේ. එතකොට ඒකේ ප්‍රත්‍ය වෙන ආකාරය පිළිබඳව කතාකරා. ඒ අවිද්‍යාව කියන එක තිබුණොත්, අනිවාර්යයෙන් ම සඞ්ඛාර වෙනවා. දැන් මට

අකුසල් නො වුණාට, මගෙන් වෙන්න පුළුවන් බව තියෙන නිසා ඒ අකුසලයන්ගෙන් යුක්ත යි කියන එක.

ඉතින් ඒ නිසා ඒ විදියට සඞ්ඛාරය පිළිබඳව පුඤ්ඤාභි-අපුඤ්ඤාභි වශයෙන් කතා කරා. ඒක අපි ඊළඟවාරයේ මේක ටිකක් බෙදලා, ඒ සඞ්ඛාරය ඇතිවෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි කතා කරමු. ඊට අමතරව සඞ්ඛාර ශබ්දය පිළිබඳව අපි කතාකරා, විවිධ අර්ථවල යෙදෙන බව. ඒවාත් හරි වැදගත්. අපි මේ සාසනයේ අපි සමහරවිට ධර්ම ප්‍රචාරය කරන කොට, ධර්මය තව කෙනෙකුට කියා දෙන කොට, ඒ අර්ථ නිවැරැදිව අරගෙන ඒවා විග්‍රහ කරන්න, සාසනයේ නිවැරැදිව අපට පෙන්නන්න මේවා වටිනවා. ඉතින් ඒ නිසා හොඳයි මේ සියලු දේවල් පිළිබඳව ඔබට ප්‍රශ්න ගැටලු තියෙනවා නම්, විමසන්න අවස්ථාව දෙනවා. හැම දෙනාට ම. තෙරුවන් සරණ යි.

---------- ---------- ---------- ---------

**ප්‍රශ්නයඃ-** ස්වාමීන් වහන්ස, අපි දැන් සිත් පිළිබඳව ඉගෙනගන්නාකොට දැන් පුඤ්ඤාභිසඞ්ඛාර කියනකොට අපි ලෞකික කුසල් සිත් ටික ගත්තොත්, අපට හොඳට ම තේරෙනවා ස්වාමීන් වහන්ස, අවිද්‍යාව කියන එක ඒ සිත්වල නොයෙදෙන බව දන්නවා, ඒක කුසල සිතක් නිසා. එතකොට අවිද්‍යා ප්‍රත්‍යයෙන් ඒ කුසල සංස්කාරයක් එනවා කියන කොට අහලා තියනවා, අවිද්‍යාව කියන එක උපනිශ්‍ර ප්‍රත්‍යයෙන් තමයි ඒකට යෙදෙන්නේ කියලා. ඒකේ සත්‍යතාවයක් තියෙනවාද? ඒක කොහොම ද තව දුරටත් තේරුම්ගන්නේ කියන එක පොඩ්ඩක් දැනගන්න ඕන ස්වාමීන් වහන්ස, ඒ කියන්නේ අතීත අවිද්‍යාව නිසා ද,

නැතිනම් කොහොමද ඒක හරියට ම තේරුම්ගන්නේ කියන එක.

**පිළිතුර**:- ඒ මහත්මයා අහපු ප්‍රශ්නය ඉතා වැදගත්. මම ඒක කොහොමත් ඊළඟ වාරයේ දී මේ පුඤ්ඤාභිසඞ්ඛාරයට, අපුඤ්ඤාභිසඞ්ඛාරයට, ආනෙඤ්ජාභිසංඛාරයට අවිද්‍යාව ප්‍රත්‍යවෙන ආකාරය පිළිබඳව කොහොමත් කතා කරනවා. ඒ නිසා අපට ඒකේදී බොහෝ විස්තර අට්ඨකතා අනුසාරයෙන් හා ඒ ඒ දේශනානුසාරයෙන් ඔබට දැනගන්න පුළුවන්.

නමුත් ඒක පෙළදහමේ ම තියෙන එකක්. අභිධර්මපිටකය ගත්තහම පට්ඨානප්‍රකරණයේ ඊට අමතරව අපට තවත් ඊට මෙහා ප්‍රකරණ ගත්තහම් ඒවාගේත් මේ ප්‍රත්‍යවීම පිළිබඳව පෙන්නනවා. ඉතින් ඒ නිසා සූවිසි ප්‍රත්‍ය කියලා කොටසක් කතාකරනවා. අපට අද මේ දුක උපදින හේතුව තණ්හාව යි කියලා එකක් පෙන්නුවාට, ඒවාගේ ම සංඛාරයට හේතුව අවිද්‍යාව යි කියලා එකක් පෙන්නුවාට, කවදාවත් එක ම හේතුවකින් එක ඵලයක් උපදින්නේ නැහැ. ඵලයක් උපදින්නේ නා නා හේතුවලින් කියන ධර්මතාවයක් තියෙනවා. ඉතින් ඒ නිසා ඒ හේතු ප්‍රත්‍යභාවයන් පෙන්නනකොට විශේෂයෙන් මේ අවිජ්ජාව කියන එක සංඛාරයට අවිද්‍යාව නමැති හේතුව ලංකරළා කතා කළහම ඒක ප්‍රත්‍ය වෙන්න පුළුවන් ආකාර දෙකකුයි ඒ පෙන්නුවේ. සම්ප්‍රයුක්තව යෙදෙන්න පුළුවන්. ඊට පස්සේ උපනිශ්‍රය වශයෙන් යෙදෙන්න පුළුවන් කියන එක. සම්ප්‍රයුක්තව යෙදෙනවා කියන්නේ සිතේ ම ඒ ධර්මය යෙදෙනවා. ලෝබය. ඉතින් ඒ නිසා ඒකේ ඒ අකුසලයන්ගේ ඒ හිතේ ම ලෝභය යෙදෙනවා කියන එකට අපට ප්‍රශ්නයක් නැහැ. එහෙම හිතේ ම සම්ප්‍රයුක්තව, එකටම යෙදෙන්න පුළුවන්. රූපයත් එක්ක

සම්ප්‍රයුක්තවෙලා නෙවෙයි. නාම ධර්ම අතර සම්ප්‍රයුක්තව මේ අකුසලය තුළ අවිද්‍යාව, එහෙම නැතිනම් මෝහය කියන ධර්මය යෙදෙන්න පුළුවන්. නමුත් මේ කුසල් කරන කොට, පුඤ්ඤාභිසඞ්ඛාර, ආනෙඤ්ජාභිසංඛාර, මේ දේවලුත් කරන කොට අවිද්‍යාව ඒ සිතේ නො යෙදුණාට එහෙම අවිද්‍යාවක් නො තිබුණා නම් එබඳු සඞ්ඛාරයක් රැස්වෙන්නේ නැහැ. ඒ නිසා නො දන්නාකම කියන එක ඔහු තුළ අප්‍රහීණව තියෙන නිසා ලෝක සත්ත්වයා භව තණ්හාවෙන් පින් කරනවා. කුසල් කරනවා. ධ්‍යාන ලබාගන්නවා. එතකොට මේ ධ්‍යාන ලබන්න කෙනෙක් වීර්යය කරන කොට දානමය, සීලමය පුන්‍යකර්මයන් කරන කොට, ඒ සිතේ අවිද්‍යාව යෙදිලා නැහැ. නමුත් මේ සසර පිළිබඳව නො දන්නාකම නිසා ඒ යහපත් කියලා හිතාගන්න දේවල් පවා යම් ආකාරයකින් ඒවා ග්‍රහණය කරගෙන, ඒවා තුළ නිත්‍යභාවය ඇතිකරගෙන කුසල් කරනවා. එතකොට ඒ වෙලාවේ දී අවිද්‍යාව කියන එක බලවත් ලෙස උපකාරවෙලා තියෙනවා.

ඒ උපනිශ්‍රය කියලා කියන්නේ ඒකයි. නිශ්‍රය ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය කියලා ප්‍රත්‍ය දෙකක් තියෙනවා. උපනිශ්‍රය ප්‍රත්‍යය කියලා කියන්නේ බලවත් ලෙස උපකාර වීම යි. උදාහරණයක් වශයෙන් ගත්තොත් අපට ලෝභය කියන එක අප්‍රහීණව තියෙන නිසා තමයි කෙනෙක් පිනට ලෝභ කරන්නේ. ලෝභයෙන් පින් කරන්නේ. හැබැයි ඒ කරාට ඒ හිතේ ලෝභය යෙදිලා නැහැ. නමුත් එයාගේ සන්තානගතව, අප්‍රහීණව තියෙන නිසා තමයි එහෙම පින වුණත් අල්ලාගැනීමේ හැකියාවක් ඔහුට ඇවිල්ලා තියෙන්නේ. ඉතින් අන්න ඒ නිසා ඒ වාගේ මේ උපනිශ්‍රය කියලා කියන්නේ බලවත් ලෙස උපකාර වෙනවා. හැබැයි ඒක යෙදිලා නෙවෙයි. ඒක උපකාර වෙන්නේ යෙදිලා නෙවෙයි. ඒ නිසා

අපි ඒක උපමා අනුසාරයෙන් අපි ඊළඟ වාරයේ දී, මේ සඞ්ඛාරය පුඤ්ඤ-අපුඤ්ඤ-ආනෙඤ්ජාභි වශයෙන් අවිද්‍යාව මේවාට ප්‍රත්‍යවෙන ආකාරය අපි ප්‍රත්‍යය අරගෙන අපි කතාකරමු.

දැනට කෙටියෙන් මතකතියාගන්න: මෙහෙම ප්‍රත්‍ය දෙකක් තියෙනවා. ඒක ඇත්තක්. එතකොට ඒක සම්ප්‍රයුක්ත හා උපනිශ්‍රය වශයෙන්, ඒ කියන්නේ එකට යෙදීම් වශයෙන් අකුසලයන්ගේ එකට ම යෙදෙනවා. නමුත් කුසලයන්ගේ එහෙම යෙදෙන්නේ නැහැ. ඒක විප්‍රයුක්ත වශයෙන් ප්‍රත්‍යවෙනවා. උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යවෙනවා කියලා කියන්නේ උපකාර භාවයෙන්, බලවත් ලෙස උපකාර කරනවා. ඒ නිසා තමයි සමහර අය පින කියන එක ඇඩිව අල්ලාගෙන ඒවායේ ඇලිලා, ගැලිලා කරන්නේ. සමහර අය ඒ පින ම කරනවා. හැබැයි ඒ වාගේ, ඒ තරම්ම ඇලෙන්නේ නැහැ. එහෙනම් මේ උපනිශ්‍රයභාවය කියන එක අඩුවැඩි වශයෙන් ඒ සන්තානවල යෙදෙනවා. ඒ අනුව තමයි ඒක, අපි හොඳට ඒ එකක් ඉදිරියට අරගෙන වටහාගත්තොත් තමන්ට මේ උපනිශ්‍රය ප්‍රත්‍යයේ ශක්තිය කියන්නේ මොකක් ද කියන එක ඔබට වටහාගන්නට පුළුවන්. ඒක අපි ඉදිරියේ දී, ඊළඟ දේශනාවේ දී ටිකක් වැඩිපුර කතාකරමු. දැනට මෙහෙම ප්‍රත්‍යභාවයන් දෙකක් තියෙනවා කියන එක මතකතියාගන්න.

----------

**ප්‍රශ්නය:-** ස්වාමීන් වහන්ස අපි අර සංස්කාර සඞ්ඛත සංස්කාර අසංඛත සඞ්ඛාර. අසඞ්ඛණ සංඛාර, පයෝග අභිසඞ්ඛාර කියන කොට පැහැදිලි වුණා මදි ස්වාමීන්

වහන්ස. එතකොට එතැන දැන් අපිට අදාලවෙන්නේ දැන් අපේ මේ දැක්ම ගවේශණය කරන කොට මේ ගැන අපි පුහුණුවෙන කොට දැනගන්න ඕන දේ තමයි අභිසඞ්ඛරණ සංඛාර, එතකොට ස්වාමීන් වහන්ස, මේ අනික් සඞ්ඛාර, සඞ්ඛත සංකාර, අභිසංඛත සංඛාරවල තියෙන යෙදීම මොකක් ද. අපට ඒක වැදගත්වෙන්නේ ඇයි ස්වාමීන්වහන්ස මෙතැන දී සාකච්ඡාකරන්න.

**පිළිතුර:-** එතැන වැදගත් වෙන්නේ අපට සංඛත සඞ්ඛාර කියන එක වැදගත් වෙන්නේ විදර්ශනා කරන කොට එතැන දැන් බුදුරජාණන් වහන්සේ, සබ්බෙ සඞ්ඛාරා කියලා කිව්වේ, ඒ කිව්වේ සියලු සංස්කාරයෝ කියලා ගත්තේ එතැන අපි ගත්තොත් එහෙම ඒ ප්‍රත්‍යයෙන් හටගත්තු සියලු ධර්මයෝ ගැන යි කිව්වේ. සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති කියලා බුදුරජාණන් වහන්සේ යම් ධර්මයක් දේශනා කරළා තියෙනවා. එතකොට එතැන සඞ්ඛත සඞ්ඛාරයක්. එහෙනම් ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්මයන් තියෙනවා නම්, මේ සියල්ල ම අනිත්‍ය ධර්මයට යටත්. ඒ නිසා තව පැත්තකින් කිව්වොත් යම් ධර්මයක් ප්‍රත්‍යයෙන් හටගත්තා නම්, ඒ සියලු ධර්ම අනිත්‍ය යි. ඒ නිසා සඞ්ඛාර කියන වචනයෙන් බුදුරජාණන් වහන්සේ හකුලුවලා පෙන්නනවා, මේ සියලු, නාම-රූප සියලු ධර්මයෝ තුන්භූමිය අනුව ගියපු සියලු දේවල් පෙන්නනවා. දැන් ඕක අපි ඔය විදියට නො කියා අපි මේක එකින් එක පෙන්නන්න ගියොත් මේක මහා අවුලක් වෙනවා. ඉතින් ඒ නිසා සමහර දේවල් බුදුරජාණන් වහන්සේ හකුලලා, කැටිකරළා, ලොකු අර්ථයක් පෙන්නනවා. ඉතින් ඒ නිසා එතැන සඞ්ඛත සඞ්ඛාර කියලා යම් තැනක තියෙනවා නම් ඒ කිව්වේ මේ අනිත්‍යයි කියලා කියන අපි රැස්කරන මේ කුසල්, අකුසල්, හෝ පින්පවු විතරක් නෙවෙයි, මේ හැම දෙයක් ම අනිත්‍යභාවයට

පත්වෙනවා. ඒ වාගේ දෙයක් තේරුම්ගන්න අපට ඒ වාගේ දෙයක් අවශ්‍ය වෙනවා. ඊට පස්සේ, අභිසඞ්ඛත සඞ්ඛාර කියන එක අපට වැදගත් වෙන්නේ එතකොට අප තුළ උපදින විපාක ටික තමයි එතැන ගන්නේ. කර්මයෙන් හටගත්තු, රූපාරූප ධර්මයෝ හා එතැන රූපයත් ගන්නවා, රූප විපාක නෙවෙයි. නමුත් එතැන රූපයත් කර්මජ රූප කියලා කොටසක් තියෙනවා. ඉතින් එතකොට ඒ කර්මජ රූප කියන ඒවා මේ කර්මයෙන් හටගත්තු දේවල්. ඒ කර්මයෙන් හටගත්තු රූපවලට අපට බලපෑම් කරන්න බැහැ. අපේ හිතේ චේතනාව මත ඒවා උපදින්නේ නැහැ. ඒ නිසා ඒ ඒ කර්ම ප්‍රත්‍යය තියෙන තාක් කල් ඒ ඇහැ, කන නාසය, මේ ධර්මයෝ හටගන්නවා. අපි රූප බැලුවත්, නැතත්, ඒ ඇහැ කර්මයෙන් ඇතිවෙමින්, නැතිවෙමින් පවතින්නේ. ඒ කන, නාසය ඇතිවෙමින්, නැතිවෙමින් පවතින්නේ.

ඒ වාගේ ඊට පස්සේ විපාක ටික ගත්තහම, අපි හිතමු අපට යම් වේලාවක ඉෂ්ඨවූ විපාක ලැබෙනවා. අනිෂ්ඨ වූ දේවල් දකින්න අහන්න ලැබෙනවා. සමහරවිට අපට යම් දේවල් නිසා නොයෙක් දේවල් කුසල වශයෙන් හොඳ නරක වශයෙන් වෙන්න පුළුවන්. මෙහෙම ගත්තහම මේ ඔක්කෝම, දැන් චක්ඛු විඤ්ඤාණ සෝතවිඤ්ඤාණ ආදී දේවල් ගත්තහම මේ ඔක්කෝම කර්මයට අනුරූපව ලැබෙන ඒවා. කෙනෙකුට හොඳ දේවල් දකින්න අහන්න ලැබෙනවා. ඒ ලැබෙන්නේ ඔහු කරපු කුසලය අනුව යි. කෙනෙකුට නරක දේවල් අහන්න දකින්න ලැබෙනවා. ඒ ලැබෙන්නේ ඔහු කරපු අකුසලය අනුව යි.  එම නිසා අභිසඞ්ඛත සඞ්ඛාර කියන එක විපස්සනාවට අපට ආදේශ කරලා ගන්න පුළුවන්. අපේ ජීවිතයට. එතකොට එහෙනම් මේ විදියේ දේවල් උපදින්නේ විපාකවශයෙන් විපාක ධර්ම ටිකක් තියෙනවා නම්, ඒවා

කර්මයේ ආනුභාවයෙන්, කර්ම ශක්තිය නිසා ලැබිච්චි දේවල් නේ ද. ඉතින් ඒ නිසා මේවා කෙනෙක් පුද්ගලයෙක් ඇතිකරපු දේවල් නෙවෙයි. මම ඇතිකරගත්තු දේවල් නෙවෙයි. කර්මය නිසා හටගත්ත දේවල් කියලා මේ අනාත්මයට තේරුම්ගන්න ඒ දේවල් වැදගත් වෙනවා. ඉතින් ඒ නිසා මේ සියල්ල දැනගතයුතුයි කියලා අනිවාර්යයක් නැහැ. කෙනෙකුට ධර්මය අවබෝධය කරා යන්න ත්‍රිලක්ෂණය පහසු කරගැනීම සඳහා මේවා වැදගත්වෙන්න පුළුවන්.

----------

**ප්‍රශ්නය:-** ස්වාමීන් වහන්ස මේ අනිමිත්ත චෙතොසමාධිය කියන්නේ මේ මොන ගණයටද? පුඤ්ඤාභි ද? අපුඤ්ඤාභි ද? ඒක මේ නිරෝධ සමාපත්තිය කියන තත්ත්වයමද ස්වාමීන් වහන්ස? නැතිනම් වෙනසක් තියෙනවා ද?

**පිළිතුර:-** අනිමිත්තචෙතොවිමුක්තිය කිව්වහම ඒක නිරෝධසමාපත්තිය නෙවෙයි. එතැන පෙන්නන්නේ අර්හත්ඵලය පිළිබඳව යි. අනිමිත්තචෙතොවිමුක්තිය බෙදලා පෙන්නන්න පුළුවන්. සෝතාපත්තිඵල, සකදාගාමී, අනාගාමී, අර්හත් කියන මේ පල හතරම අනිමිත්ත චේතොවිමුක්තියෙන් කතාකරන්න පුළුවන්. අපි බෙදලා කතා කරාම නිශ්පරියායකින් කිව්වොත් අර්හත් ඵලයට අනිමිත්ත චෙතොවිමුක්තිය, අප්පණිහිතචෙතොවිමුක්තිය, කියලා කියන්න පුළුවන්. එතකොට ඒක එහෙම ඵලයක් වශයෙන් ගත්තහම පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි කියන සඞ්ඛාර තුනට යන්නේ නැහැ. මොකද දැන් අපි අනිමිත්ත චෙතොවිමුක්තිය කියන එක අපි කතා කරොත් විපාකයක් වශයෙන්, එතකොට ඒක අර කියන සංඛාරයට යන්නේ

නැහැ. එතකොට මාර්ගයට ලැබුණු ඵලයක් වශයෙන් කතාකරන්න පුළුවන්. ඒ වාගේම අනිමිත්තචේතොවිමුක්තිය පිළිබඳව ඊට මෙහාත් කතාකරන්න පුළුවන්. ඒ කියන්නේ අර මිදීම කියන එක වෙන්න පුළුවන් ආකාර ටිකක් තියෙනවා නේ. තදංග වශයෙන් මිදීම. විශ්කම්භණ වශයෙන් මිදීම, සමුච්ඡේද වශයෙන් මිදීම කියලා කතාකරන්න පුළුවන්. මේ අනිමිත්ත කියන පරියාය විශ්ඛම්භන වශයෙන් මිදීම කියන එකට ගත්තොත්, කෙනෙක්ව, අපි උදාහරණයක් වශයෙන් කියමුකෝ, කෙනෙක් රූපාවචර ධ්‍යාන ලබාගත්තා. රූපාවචර ධ්‍යාන ලබාගත්තු නිසා ඔහු පටිඝ සිත් දෙකෙන් මිදුනා. ද්වේශ මූල සිත්දෙකෙන් මිදුනා. ධ්‍යානය ලබපු කෙනාට ද්වේශමූල සිත් දෙක උපදින්නේ නැහැ. එතකොට ඊට අමතරව අපි කියමුකො කෙනෙක්ව විදර්ශණා කරනවා. අනිච්චානුපස්සනාව වැඩීම නිසා ඔහුට බොහෝ අකුසල ධර්‍මයන්, ලෝභ මූල, ද්වේශ මූල, අකුසල ධර්‍මයන් විශ්කම්භන වශයෙන් යටපත්වුනා. එතකොට එයාට අනිමිත්තානුපස්සනාවෙන් යම් ප්‍රමාණයක් මිදුණා. හැබැයි ඒවාට කියන්නේ පුඤ්ඤාභිසඞ්ඛාර කියලා පමණයි. ඒවා ඔක්කෝම කුසල්. ඒවාට කියන්න වෙන්නේ ඤාණසම්ප්‍රයුක්ත කුසල් සිත් කියලා කියන්න පුළුවන්. පටලාගන්න එපා මේක. නමුත් අපි අර බෙදීම් කරන්න පුළුවන් කියලා මේ න්‍යායයන් ටිකක් කිව්වේ. නමුත් මේ ඔක්කෝම අතහැරලා දාන්න. ඔබට මේක පැටලෙනවා නම්. අතන විතරක් ඕනනම් ගන්න. ඒ කියන්නේ අනිමිත්තචේතෝවිමුක්තිය කියන කොට අනිමිත්ත කියලා කිව්වේ එයා අනිච්චානුපස්සනාව වැඩීමෙන්, භාවිතා කිරිමෙන් විදර්ශනා කරළා යමෙක් මිදීමට පත්වුණා නම් එතකොට, සෝවාන් ඵලයට පත්වුණා නම් ඒ ඵලයටත් මිදුනා කියලා කියනවා. අනිමිත්ත චේතෝවිමුක්තිය කියනවා.

සකදාගාමී ඵලයට, අනාගාමී ඵලයට, අර්හත් ඵලයට පත්වුණා නම් ඒත් අනිමිත්ත චේතෝවිමුක්තිය කියලා කියනවා. එතකොට ඒ විමුක්තියක්. එතකොට ඵලයක්. ඒක හැම වේලාවේ ම පුඤ්ඤ, අපුඤ්ඤ, ආනෙඤ්ජාභි කියන සඞ්ඛාරයට දාන්නත් බැහැ. ඒ වාගේ ම ඒක අවිජ්ජා පච්චයා සඞ්ඛාරා කියන ගොඩට කෙසේත් ලංකරන්න පුළුවන්කමක් නැහැ. ඒවා කවදාවත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් නොවන නිසා. පැහැදිලි ද අපේ මහත්මයා?

**ප්‍රශ්නයඃ-** ඒ ගැටලුව ආවේ ස්වාමීන් වහන්ස අර චූලසුඤ්ඤත සූත්‍රයේ තියෙනවා අන්තිමට එනකොට අනිමිත්තචේතෝසමාධිය ගැන කියලා. ඒකත් අර සංඛත යි, අභිසඞ්ඛතයි කියලා ඊට පස්සේ නේ මිදෙන්නේ. අන්න එතැන අවස්ථාව කොහොමද කියලා තමයි ගැටලුව ආවේ.

**පිළිතුරඃ-** එතැන එහෙම ගන්නේ ඒකත් ඒ ඵලය කියන එකත් සඞ්ඛත ධර්‍මයක් නේ. ඉතින් ඒ නිසා එතැන මේ කෙනෙකුට මේ මාර්‍ගඵල පිළිබඳව මුලාවෙන්න පුළුවන්. ඒ කිව්වේ තන්හාව ආශාව ඇතිවෙන්න පුළුවන්. මාර්‍ගය ලබපු කෙනෙක් නෙවෙයි. එයාට මේ තමන් මාර්‍ගය පිළිබඳව ඵලය පිළිබඳව අදහසක් ඇතිකරගෙන ඒකේ නිත්‍යභාවයන් ඇතිකරගන්න, ආශාව ඇතිකරගන්න. කෙනෙකුට ඒක විදර්ශනා කරන කොටත් එනවා නේ. විදර්ශනා ඥාණ පිළිබඳව. අන්න ඒ නිසා තමයි ඒ ඵලය කියන එකත් සඞ්ඛත යි. ප්‍රත්‍යයෙන් හටගත්ත දෙයක්. නිවන විතරයි අසංඛත වෙන්නේ. ඇයි ඵලය සඞ්ඛත වෙන්නේ. ඒ මාර්‍ග පළය කියන එකත් හටගන්නේ ස්කන්ධ ඇසුරුකරගෙන යි. ඒ නිසා ස්කන්ධ කියන එක, ඒවා සඞ්ඛත ධර්‍ම යි. හැබැයි ඒවා බෙදන්නේ, ලෞකික ලෝකෝත්තර වශයෙන් බෙදුවාට සංඛත අසංඛත

භාවයෙන් සඞ්ඛතම යි. හැබැයි සංඛත වුණාට ඒ සංඛතයේ වෙනසක් තියෙනවා. ඒ ස්කන්ධයෝ, මාර්ගඵල පිළිබඳව ස්කන්ධයෝ සඞ්ඛතවුනාට ඒවා ලෝකෝත්තර යි. ඒවා නිවන අරමුනුවෙලා තියෙන්නේ. හැබැයි අනිත්‍ය ලක්ෂණයට, දුක්ඛ ලක්ෂණයට, අනාත්ම ලක්ෂණයට, පොදු යි. ඇයි ඒ වාගේ ඇතිවීමක්, නැතිවීමක් පෙනෙන්න තියෙන නිසා. ඉතින් අන්න ඒ නිසා ඒක මතුකරළා දෙන්න තමයි ඒ එතැනම කාරණාව කතා කරලා තියෙන්නේ.

----------

**ප්‍රශ්නයඃ-** ස්වාමීන් වහන්ස, පයෝගාභිසංස්කාර යි, විදර්ශනා භාවනාවයි අතර තියෙන සම්බන්ධතාවය ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න පුළුවන් ද?

**පිළිතුරඃ-** ඒක හොඳ යි. පයෝගාභිසඞ්ඛාර කියන කොට, පයෝගාභිසඞ්ඛාර කායසඞ්ඛාර වචීසඞ්ඛාර චිත්තසඞ්ඛාර වශයෙන් ම යෙදෙන්න පුළුවන්. එතකොට කෙනෙක්ව කය මුල්වෙලා අකුසලයක් කරන්න කය මෙහෙයවාගෙන යන කොට අපි කියමුකො, සතෙකුට ආයුධයකින් ගහන කොට මේකේත් තියෙන පයෝගාභිසඞ්ඛාරයක්. එතකොට කය මුල්වෙලායි කෙරෙන්නේ. එතකොට ප්‍රයෝග කිරිමක් තියෙනවා, වචනයෙනුත් එහෙම වෙනවා. විශේෂයෙන් විදර්ශනාවෙනුත් මේක අපි යෝනිසෝමනසිකාරයෙන් අකුසලය දුරුකරගන්න නොයෙක් ප්‍රයෝගයන් කරනවා. උත්සාහවත් වෙනවා. අපි හිත දුර්වල වෙනකොට ථිනමිද්ධය වාගේ ඇතිවෙන කොට ඒ ථිනමිද්ධයෙන් දුරුවෙන්න අපි හිත උත්සාහවත්කරගන්නවා. වීර්‍ය්‍යය ඇතිවෙන නොයෙක් මනසිකාරයන් කරනවා. එතකොට මෙතැනත් තියෙනවා

ප්‍රයෝගයක්. ඒ පයෝගාභිසඞ්ඛාරය කුසල්. එතකොට ඒ කුසලය විපස්සනාවට අදාලවෙන්නේ අකුසලයක් යටපත්කිරීම සඳහා කරන ප්‍රයෝගයක්. උත්සාහයක්, වීයර්‍යයක්. ඒකයි අර පයෝගාභිසඞ්ඛාරයේ කායික වීයර්‍යය, චෛතසික වීයර්‍යය, කියලා කොටස් දෙකකට බෙදන්නේ. මෙතැන චෛතසික වීයර්‍යයක් කියලා කියන්නේ. ඒ නිසා අපි දැන් කියමු උද්ධච්චය ඇතිවුණහම, ලෝභයක් ඇතිවුණහම ඒ ලෝභයෙන් මිදෙන්න, රාගයක් ඇතිවුණහම ඒකෙන් මිදෙන්න අපි නොයෙක් ආකාරයේ මනසිකාරයන් කරලා අකුසලයෙන් මිදෙන්න ප්‍රයෝග කරනවා. එතකොට ඒ වාගේ මේ පයෝගාභිසඞ්ඛාර විදර්ශනා වීථි තුළ විදර්ශනා භාවනාව තුළ නොයෙක් අයුරින් යෙදෙන්න පුළුවන්. හැම වෙලාවේ ම පයෝගාභිසඞ්ඛාරය කියන එක යෙදෙන්නේ කෙනෙකුගේ වැඩිපුර යෙදෙන්න පුළුවන් අකුසල බලපෑම වැඩිවෙන කොට මෙයාට පයෝගය වැඩිපුර යොදන්න වෙනවා. යම් වෙලාවක එයා ධ්‍යාන ලබලා හෝ නීවරණ යටපත්වෙලා සති සමාධි හොඳට තියෙනවා නම් විදර්ශනාව ස්වභාවයෙන් ම යනවා. කරුණු කාරණා මතුවෙවී තේරෙවී උදය වැය තේරෙනවා. ත්‍රිලක්ෂණය වැටැහෙමින් එයාට ස්වභාවයෙන් ම යනවා. එයාට එච්චර ලොකු පයෝගයක් ඕනේ නැහැ. ඒ නිසා මේ පයෝගය යි කියන එක වැඩිපුර වැඩිපුර යොදවන්න වෙන්නේ නීවරණයන්ගේ බලපෑම හා ඊට පස්සේ මේ තියෙන අකුසල ධර්මයන්ගේ බලපෑම නිසායි එහෙම වෙන්නේ. ඒ නිසා විදර්ශනාවේදී ත් ඒ කෙලෙස් ඇති නැති භාවය අනුව මේ පයෝගාභිසඞ්ඛාරය අඩුවැඩිවීම් වශයෙන් යෙදෙන්න පුළුවන්.

----------

**ප්‍රශ්නය:-** අර අවිජ්ජාපච්චයාසඞ්ඛාරා කියන කොටසේ සඞ්ඛාර කියන තැන සමහර ස්වාමීන් වහන්සේලා උළුප්පන්න හදනවා ඔතැන ඒකවචනයෙන්. ඒ කියන්නේ කායසඞ්ඛාරො, වචීසඞ්ඛාරො චිත්ත සඞ්ඛාරො කියලා ඒකවචනයෙන් කියනවා කියලා, අන්න ඒ ගැන පොඩි පැහැදිළිකිරිමක් කරන්න. එතැන ඒකවචනයෙන් කියන්නේ සඞ්ඛාර කියන්නේ කායසඞ්ඛාර වචීසඞ්ඛාර චිත්තසඞ්ඛාර කියන්නේ නැතුව කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො ... ...

**පිලිතුර:-** එතැන ***තත්ථ කතමා අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා දැන් එතකොට අපි එතැන පදගථාර්ථය තේරුම්ගන්න ඕනේ. මෙය බලන්න: ***තත්ථ කතමෙ අවිජ්ජාපච්චයා සඞ්ඛාරා: පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො*** - මෙතැන මාතෘකා කරා ***සඞ්ඛාරා*** කියලා. එතකොට මේ පාළි ව්‍යාකරණ අපි හොඳට දැනගන්න ඕනේ. එතකොට මෙතැන ***අවිජ්ජාපච්චයා සඞ්ඛාරා*** කියලා බහුවචනයෙන් කිව්වේ, ***පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, ආනෙඤ්ජාභි, කාය, වචී, චිත්ත*** කියලා සඞ්ඛාර ඔක්කෝටම ගැන හඳුන්වන්න තමයි මෙතැන ***අවිජ්ජාපච්චයා සඞ්ඛාරා*** කියන බහුවචනයෙන් තිබ්බේ. පස්සේ මේවා එකින් එක මාතෘකා කරනකොට ***පුඤ්ඤාභිසඞ්ඛාරො*** කියලා කිව්වේ ඒක එක ගොඩක් හැටියට ගෙන යි. මේකේ එකක් තියෙනවා කියන අර්ථයෙන් නෙවෙයි, ඒක එක ගොඩක් හැටියට ගෙන ඒක අපට ඒකවචනයකින් කියන්න පුළුවන්. ඔබට තේරෙන්න ***පුඤ්ඤාභිසඞ්ඛාරො*** කියලා නේ එතැන තියෙන්නේ. ***කායසඞ්ඛාරො,*** කියන එක විතරක් නෙවෙයි, ***පුඤ්ඤාභිසඞ්ඛාරො*** කියන එකත් එක වචනයෙන් තියෙන්නේ. එතකොට අපට ඒකවචනයෙන් කියන්න පුළුවන්

ඒ කුසල් චේතනා ඔක්කෝම තිබුණත්, මේ ඔක්කෝම කුසල් කියන අර්ථයෙන් එකක්. ඒ නිසා ***පුඤ්ඤාභිසඞ්ඛාරො*** කියලා කියන්න පුළුවන්. ***අපුඤ්ඤාභිසඞ්ඛාරො*** කියන එකත්, සියලු අකුසල්. අපි දැන් අකුසල් පැහැදිලිව දන්නවා. මෙතැන ඒකවචනයෙන් තියෙන්නේ. නමුත් අපි දන්නවා ලෝභ මුල්වෙලා අකුසල් ඇතිවෙනවා. ද්වේශය මුල්වෙලා ඇතිවෙනවා. මෝහය මුල්වෙලා ඇතිවෙනවා. අකුසල් සිත් දොළහක් පිළිබඳව, අපි අභිධර්මය පැත්තකින් තැබුවත් මේ සූත්‍රවලත් තියෙනවා ද්වෙශය මුල්වෙලා අකුසල්, ලෝභය හෙම නැතුව එතැන ම ගොඩක් තියෙනවා. නමුත් මේ ඔක්කෝම එකතුකරළා පුඤ්ඤාභිසඞ්ඛාරො කියලා, ඔක්කෝම අකුසල් කියන ඒකත්වයෙන් අරගෙන සඞ්ඛාරො කිව්වා. අනෙඤ්ජාභිසඞ්ඛාරත් එහෙම යි. කායසඞ්ඛාරො කියන ඒවාත් එහෙම යි. කයෙන් වෙන්න පුළුවන් සියලු දේවල් එක ගොඩක් හැටියට සළකලා කායසඞ්ඛාරො කියන එකවචනයෙන් කියනවා. හැබැයි මේ හය ගැන ම පොදුවේ මුලින් මාතෘකා කළ නිසා එතැන ***අවිජ්ජාපච්චයා සඞ්ඛාරා*** කියලා සඳහන්වෙලා තියෙනවා. පස්සේ මේවා ගොඩවල් ගොඩවල් එක එක පෙන්නන කොට සඞ්ඛාරො කියලා ශබ්ද කරනවා මිසක් එහෙම නැතුව එතැන ඒ සඞ්ඛාරො කියලා එකවචනයෙන් තියෙන්නේ එකයි එතැන කතාකරන්නේ කියන අර්ථයෙන් නෙවෙයි. මම හිතන්නේ පැහැදිලිවෙන්න ඇති අපැහැදිලිකමක් තියෙනවා නම් අහන්න.

----------

**ප්‍රශ්නයඃ-** අවසරයි ස්වාමීන් වහන්ස, ආයතනවලට අරමුණු ගැටීමේ වෙලාවේදී ඇතිවන ස්කන්ධවලට මම තේරුම්ගත්තු විදියට එතැන දී ඇතිවෙන්නේ ස්වාමීන් වහන්ස, සඞ්ඛත

සඞ්ඛාර නේ. එතකොට ස්වාමීන් වහන්ස දැන් අපි මෙතැන ඒ වෙලාවේ දී අපි දැන් අර කියනවා දැකීම දැකීම සැනෙන් අත්දැකීමේ දී එතැන ඒක දැකීමට සංඛාරයක් කියලා දැකීමේ දී ස්වාමීන් වහන්ස, කොහොම ද අපි එතැන ඒ වෙන කොටත් අප තුළ පුඤ්ඤාභිසඞ්ඛාර අපුඤ්ඤාභිසඞ්ඛාර ඇතිවෙලා ඉවරයි. ස්වාමීන් වහන්ස එතකොට අපි කොහොම ද එතැනදී අපි තේරුම්ගන්නේ මේක කොහොමද සංඛත කියලා දකින්නේ කියන එක පොඩ්ඩක් පැහැදිළි කරලා දෙන්න.

**පිළිතුරː-** එතැන දී ඇත්තට ම සඞ්ඛත සඞ්ඛාර කිව්වහම පොදුවේ ඔක්කෝට ම කියන්න පුළුවන්. කුසල් අකුසල් නොවන, කුසල් අකුසල් වන මාර්ග ඵල, නිවන හැර සියල්ල ම මේ සඞ්ඛත සඞ්ඛාර කියන දෙයින් අපට ගන්න පුළුවන්. හැබැයි ඒ ගත්තාට මේ සඞ්ඛත සඞ්ඛාර ඇතුළේ කතා කරොත්, මේ පුඤ්ඤාභි, අපුඤ්ඤාභි, කුසල්, අකුසල්, වශයෙන් කතාකරන්න පුළුවන්. ආනෙඤ්ජාභි වශයෙන් කතාකරන්නත් පුළුවන්. එතකොට සඞ්ඛත සඞ්ඛාරය ඇතුළේ අපි ඒ සඞ්ඛතය, සඞ්ඛතය කියන එක හටගත්තු සැනින් බිඳිලා යනවා. ඒක නොදන්නාකම නිසා ඒකයි අවිද්‍යාව කිව්වේ. අවිජ්ජා පච්චයා සඞ්ඛාරා. අන්න ඒ නිසා ඒ සඞ්ඛතයත් අපට ඇතිවෙන කොට ඒක අපට අවිද්‍යාව නිසා නෙවෙයි. ඇහැට රූපයක් ගැටීම නිසා දැකීමක් වෙනවා, චක්ඛු විඤ්ඤාණයක් පහළවෙනවා නම් එතැන තියෙන්නේ සඞ්ඛත සඞ්කාරයක්. ප්‍රත්‍යයෙන් හටගත්තු ධර්ම ටිකක්. ඒක පෙර කර්මය නිසා විපාකයක් වශයෙන් අපට හම්බවුණේ. හැබැයි ඔන්න ඒ දැකීම අවසන්වුණහම අපේ එතැන නුවණ යෙදෙන්නේ නැහැ. අවිද්‍යාව යෙදෙනවා. අවිද්‍යාව යෙදිලා, දැක්කේ අහවලා, දැකපු දේ කියලා ලෝභ ද්වේශ ආදී ඒ

අරමුණ අරහයා අප තුළ ලෝභා දී, එහෙම නැතිනම් කුසල ආදී වශයෙන්, නොයෙක් සඞ්ඛාර චේතනා ඇතිවෙනවා. අන්න ඊට පස්සේ සඞ්ඛත සඞ්ඛාරය අරහයා පුඤ්ඤාභිසඞ්ඛාර, අපුඤ්ඤාභිසඞ්ඛාර ඇතිවෙන්න පුළුවන්. ආනෙඤ්ඤාභිසඞ්ඛාරත් ඇතිවෙන්න පුළුවන්. සඞ්ඛත සඞ්කාර අරමුණු කරළා. එතකොට ඒක ආරම්මණ වශයෙන්, ආරම්මණ ප්‍රත්‍යය කියලා අපට කියන්න පුළුවන් ප්‍රත්‍යයෙන්. උපනිශ්‍රය වශයෙනුත් ඇතිවෙනවා. ඒ විදියට මේ සඞ්ඛත සඞ්ඛාරය ඇතුළේ අවිද්‍යාව යෙදිලා පුඤ්ඤාභි අපුඤ්ඤාභි ආනෙඤ්ජාභි ආදිය ඇතිවෙනවා. එතකොට ඒකට කියන්නේ අභිසංස්කරණ සංඛාර කියලා යි. එතකොට ඒ නිසා ඒ වාගේ මේ අපි විදර්ශනා කරන කොටත් අරමුණක් අරගෙන අප තුළ ලෝභයක් හටගෙන මුලාවෙලා අරමුණක් ආවා නම් අපි මේක දෙපැත්තට ගලපන්න පුළුවන්. දැන් මේ අප තුළ සංඛාරයක් සකස්වුණා නේ ද? කුසලයක් හෝ අකුසලයක් කර්මයක් සකස්වුනා. අභිසංස්කරණසංඛාරයක් ඇතිවුණා. නමුත් මෙතැන තිබුනේ මොකක් ද? සංඛත සංඛාරයක් නේ ද? ඒ කියන්නෙ සංඛත සංඛාරයක් කියන කොට තේරුම මේ අදහස් කරේ මම ප්‍රත්‍යයෙන් හටගත්ත ධර්ම ටිකක් නේ ද තිබුණේ. සංඛතයක් නේ ද තිබුණේ? ඒ සංඛතය හටගෙන නිරුද්ධවෙනවා නේ ද? එහෙම තියෙන තැනක අවිද්‍යාව නිසා මට පුඤ්ඤාභිසඞ්ඛාරයක්, හෝ අපුඤ්ඤාභිසඞ්ඛාරයක් ඇතිවුණා නේ ද කියලා ඒ විදියට අපට ඒක පිළිබඳව බෙදලා විපස්සනා වශයෙන් බලන්න පුළුවන්. ප්‍රශ්නයට උත්තරය ලැබුනා ද?

**ප්‍රශ්නය:-** ඒ කියන්නේ අපේ සැහෙන දුරකට අපේ ප්‍රඥාව හීන වෙලා තියෙනවා නේ කියලා මට හිතෙනවා ස්වාමීන් වහන්ස ඒ වාගේ අවස්ථාවල. ඒ කියන්නේ සංඛතයක්

වශයෙන් දකින්න. දැන් අපි ඒ අවස්ථාවේ ප්‍රඥාව නැතිවුනොත් කොහොමත් අපට අපුඤ්ඤාය පුඤ්ඤාය වශයෙන් වෙන සංකාර ... ...(අපැහැදිලි යි.)

**පිලිතුර:-** ඒ සාමාන්‍ය පෘතග්ජන කෙනාට ගත්තහම, උදාහරණයක් වශයෙන් අපි කියමු අත ඔසවනවා කියන ක්‍රියාව මේ ක්‍රියාව හැමවෙලාවේ ම එක්කෝ ඔහුට පුඤ්ඤාභිසංඛාරයක්, එක්කෝ අපුඤ්ඤාභිසංඛාරයක් මිසක් ඒ දෙකෙන් තොරව වෙන්න බැහැ. කවදාවත් මේ අත එසවීම කියන එක විපාක සිතකින් කරන්න පුළුවන්කමක් නැහැ. විපාක සිතකට කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති පවත්වන්න බැහැ විපාක සිතකට. ඒ නිසා කෙනෙක් අත එසවීම කියන එක ඔහු කරන්නේ එක්කෝ කුසල් සිතින්, එහෙම නැතිනම් අකුසල් සිතින්. පෘතග්ජනයන්ට ක්‍රියා සිත් නැහැ. ඒ නිසා එක්කෝ කුසල්, එහෙම නැතිනම් අකුසල්. සාමාන්‍යයෙන් රහත් නො වුණු, ඊට මෙහා හැම ආයුෂ්මතුන් වහන්සේ නමක් පවා ඒක වෙන්නේ කුසල් සිතින් හෝ අකුසල් සිතින්. ඉතින් ඒ නිසා බොහෝ විට ආයුෂ්මතුන් වහන්සේලා ඒවා අකුසල් සිතින් කරනවා සිහිය මුල්වෙලා. පෘතග්ජන අයට බොහෝ විට එයා සිහිකරගෙන කුසලයක් ඇතිකර ගත්තොත් මිසක් නැතිනම් කය සෙලවීම් ආදී මේ ඔක්කෝම යෑම් ඊම් අකුසල චේතනාවන්, අපුඤ්ඤාභිසඞ්ඛාර තමයි ඇතිවෙන්නේ. නමුත් ඒ හැම එකක් ම කර්ම තමයි. හැබැයි කර්මය කොටස් දෙකකට බෙදනවා. ඒක අපි ඉදිරියේ දී කතා කරමු. කර්මයේ කොටස් දෙකක් තියෙනවා. එකක් තමයි, ප්‍රතිසන්ධිදායක ශක්තිය ඇතිකරන කර්මයක් තියෙනවා. තව කර්මයක් තියෙනවා. ඒකේ ප්‍රතිසන්ධිදායක ශක්තිය නැහැ. ප්‍රවෘත්ති විපාක පමණයි තියෙන්නේ. ඒ විදියේ ශක්තියකුත් මේ කර්මය තුළ තියෙනවා. ඒක හරි වැදගත් කාරණාවක්. ඉතින් එතකොට ඒ යම්

වෙලාවක අපි ඒ චේතනාව ද්වාරයකට පැමිනිලා, අර කියන දශ අකුසල කර්මයන් සිද්ධවුණොත් එතකොට ඒක ප්‍රතිසන්ධිදායක කර්මයක් බවට පත්වෙනවා. නමුත් අපි අත ඔසවනවා කියන එක සංඛාරයක්. ඒ සංඛාරය එක්කෝ අපුඤ්ඤාභි. පුඤ්ඤාභි. නමුත් මේ පුඤ්ඤාභි අපුඤ්ඤාභි ප්‍රවෘත්ති විපාක මිසක් ප්‍රතිසන්ධි විපාක ගෙනැත් දෙන්නේ නැහැ, හැම අවස්ථාවකම. ඉතින් ඒ නිසා ඒක මේ පටිච්චසමුප්පාද චක්‍රයේ මේ අත එසවීම කියන එක චක්‍රයේ ඉදිරියට ගිහිල්ලා තණ්හා උපාදාන භව කියන මේ තත්ත්වයන් ගොඩනැගුනහම තමයි ඒක ප්‍රතිසන්ධිදායක ශක්තියක් ඇතිවෙන්නේ. ඒ නිසා ඒකෙන් ප්‍රතිසන්ධි විපාක ගෙනැත් දෙන්න පුළුවන්. එහෙම නැතිවුණොත් එයාට සාමාන්‍ය කරන ක්‍රියාවලුත් අපි දන්නවා පුඤ්ඤ අපුඤ්ඤාභි. එහෙම වුණහම අපට මොන තරම් කර්ම රැස්වෙනවාද. අපට කවදාවත් අපායෙන් මිදෙන්න බැහැ නේ කියන අදහසක් එන්න පුළුවන්. නමුත් ඒකෙන් අපි ඒකයි මතු කරේ. ඒ සියලු කාය වචී කර්ම ප්‍රතිසන්ධිදායක කර්ම නෙවෙයි. නමුත් කර්ම යි. ඒවා අනිවාර්යයෙන් ම දාන්න වෙන්නේ එක්කෝ කුසල, එක්කෝ අකුසල. පෘතග්ජනයාට නම් කුසල්-අකුසල්. රහතන්වහන්සේ නමකට ඒ සියලු කාය වචී කර්ම උන්වහන්සේලාට කුසල් අකුසල් නැහැ. ඒවා උන්වහන්සේලාට ක්‍රියා සිත් වශයෙන් උන්වහන්සේලාට ඒවා පහළවෙනවා. අන්න ඒ වාගේ ඒ විදියට තියෙනවා. අපට ඒක තේරුම්ගන්න අපේ මහත්මයා කිව්වා වාගේ ඒ විදර්ශනා ඤාණයකින් මේවා වටහා ගත්තොත් එතකොට අපට පුළුවන් ඒවා කර්මපථ සකස් නො වන ආකාරයට කටයුතු කරන්න. ඒ වාගේ සංඛතය පුඤ්ඤාභි අපුඤ්ඤාභි වශයෙන් නොවන ආකාරයට අපට මේ කටයුතු කරගන්නත් පුළුවන්.

----------

**ප්‍රශ්නයඃ-** ස්වාමීන් වහන්ස, අර ලෝකෝත්තර ඵල සිත් ගැන පැහැදිළිකරපු එක ස්වාමීන් වහන්ස, මම තේරුම්ගත්තා හරි ද කියලා ආයෙත් අහන්නේ. දැන් සෝවාන් ඵල සිත ඇතිවෙනවා මාර්‍ගය වැඩීම නිසා. එතකොට ඒ හේතුවෙන් සෝවාන් ඵල එනවා. එතකොට ඒ ආයුෂ්මතුන් වහන්සේ සකදාගාමී වෙන කොට, සෝවාන් පළය නැතිවෙලා සකදාගාමී වෙනවා. එතකොට ඒ ආකාරයට හිතන එක හරි ද? ඊළඟට දැන් රහතන්වහන්සේලා, රහතන්වහන්සේ අර්හත් මාර්‍ගය වඩලා, රහත්වෙලා පිරිනිවන් පෑවහම ඒ ඵල සිත නිරුද්ධවෙලා යනවා. ඒකද තේරුම්ගන්න ඕන ඒ විදියට පැහැදිළිකරහම ස්වාමීන් වහන්ස,

**පිළිතුරඃ-** මේක තව පැහැදිළිකරගන්න ඕන. එහෙම දෘෂ්ඨීත් එන්න පුළුවන්. කෙනෙකුට එන්න පුළුවන් සෝවාන් වෙච්චි කෙනා සකදාගාමී වෙනවා. සකදාගාමී වෙච්චි කෙනා අනාගාමී වෙනවා කිව්වොත් ඒක වැරැදි විග්‍රහයක්. එහෙම නැතිනම් තව විදියකින් කිව්වොත් දැන් ඔහුට සෝවාන් ඵලය නැතිවෙලා සකදාගාමී තත්ත්‍වයට පත්වුණා. සෝවාන් ඵලය කියන එකෙන් අදහස් කලේ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස කියන සංයෝජන තුන ප්‍රහාණය වීමෙන් නම්, දැන් ඒ ඵලය ඉවර යි. දැන් සකදාගාමී යි. අනාගාමී කියන කොට අර ඵලය ඉවරයි කියලා අර්ථ ගන්න කොට, ඒක නැහැ කියනකොට අපිට ඒක නුවණින් ගන්න ඕන. ඒ මොකද, ඒක ඒ ඵලය නැතිවුණා නෙවෙයි. දැන් යම් කෙලෙස් ටිකක් නැතිවීම නිසා සෝවාන් ඵලයට පත්වුණා කියලා කියනවා නම්, නැවත නැවත ඒ සෝවාන් පුද්ගලයා විසින් නැවත නැවත භාවිතා කිරීමෙන් ඒ කෙලෙස්

නැතිවෙච්චි මට්ටමට, තව තියෙන කෙලෙස් ටිකක් නැතිවුණා. අපි කියමුකෝ, සෝවාන් සකදාගාමී දෙන්නා සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස කියන සංයෝජන තුණ දුරුකරළා ඉන්නවා. දැන් ඒ පුද්ගලයා අනාගාමී වෙනකොට ම ඒ කෙනාගේ ම තිබුණු අර කියපු කාමරාග පටිඝ කියන මේ කෙලෙස් දෙකත් නැතිවුණා. දැන් ඔහුට සෝවාන් කියලා කියන්න බැහැ නේ. ඔහුට කියන්න වෙන්නේ අනාගාමී කියලා යි. සෝවාන් කියලා කිව්වොත් වැරැදි යි. ඇයි? සෝවාන් පුද්ගලයාගේ නැතිවුණේ සංයෝජන තුන යි. ඒ පස්සේ අනාගාමී පුද්ගලයාගේ සංයෝජන පහක් නැතිවුණා. ඒ නිසා සෝවාන් ඵලය දැන් නැතිවුණා කිව්වොත් ඒක වැරැදි විග්‍රහයක්. මොකද ඒ පුද්ගලයාගේ නැතිවෙච්චි කෙලෙස් ගොඩට තව කෙලෙස් දෙකක් නැතිවීමෙන් ඒ සම්මතය අපි අනාගාමීයි දැන් කියලා ඒ අවස්ථාවේදී කියනවා.

ඒක හරියට කිරි අවස්ථාව දීකිරි වුණා, දීකිරි අවස්ථාව ගිතෙල් වුණා. දැන් කෙනෙක් කිරි දීකිරි වෙන කොට දැන් කිරි නෑ කියලා කිව්වොත් කිරි නෙවෙයි දැන් මේ තියෙන්නේ කියලා කිව්වොත් වැරැදි යි. හැබැයි කිරි නෙවෙයි දීකිරි. හැබැයි ඒක කිරිවලින් වෙන එකක් ද කියලා ඇහුවොත් අපට එහෙම විග්‍රහ කරන්නත් බැහැ.

ඒ නිසා ඒ විදිය අපි මේක නුවණින් තේරුම්ගන්න ඕන. සෝවාන් ඵලය නැතිවෙලා සකදාගාමී වෙනවා කියන එක නෙවෙයි අපි තේරුම්ගන්න ඕන. අර විදියට යම් කෙලෙස් ධර්ම ටිකක් නැතිවීම නිසා සෝවාන් කියලා කිව්වා නම් ඒ පුද්ගලයා ම ඉදිරියට භාවනාකරගෙන යෑම නිසා ඔහුගේ සන්ථානයේ තිබුණු තවත් කෙලෙස් ටිකක් නැතිවුණා. දැන්

ඔහුට වෙන නමකින් නම්කරන්න වෙන්නේ. අන්න ඒ විදියට තමයි තේරුම්ගන්න ඕන.

**ප්‍රශ්නයඃ-** පැහැදිලිකිරිම තේරුණා. සංඛත කියන එක ඒ විදියට පැහැදිළිකරාම හරිද ස්වාමීන් වහන්ස?

**පිලිතුරඃ-** කිසිම ගැටලුවක් නැහැ. ඒ කියන්නේ සංඛත කියන්නේ මේ සෝවාන් ඵලය නැතිවෙලා සකදාගාමී වුණා කියන අර්ථයෙන් ඒ අර්ථයෙන් ද සංඛත කියලා කිව්වේ? එහෙම නෙවෙයි එතැන සංඛත බෙදන්නේ. සෝවාන් ඵලය තුළ තියෙන, අපි ඵලය කියලා හැම වෙලාවේ ම අපි කියමුකො ඵලය කියන එක තුළ හැම වෙලාවේ ම සෝවාන් පුද්ගලයා නැහැ නේ. දැන් උදාහරණයක් වශයෙන් අපි කියමුකො සෝවාන් පුද්ගලයා සිවුරු පොරවනවා, පිණ්ඩපාතයේ යනවා, දානය වළඳනවා. එතකොටත් ඔහු ඵල සිතින් යුක්ත යි ද? නැහැ. ඒකෙන් කියන්නේ දැන් ඔහු පෘතග්ජනයි කියන එක නෙවෙයි. ඒක තේරුම්ගන්න ඕන. එතකොට යම් එයා ඵල සිතක් ලැබුවා නම්, ඒ ඵල සිතට යම් කෙලෙස් ටිකක් නැතිවුණා නම් ඒ කෙලෙස් නැවත උපදින්නේ නැහැ. ඒ නිසා ඔහු සෝවාන් කෙනෙක් ම යි. නමුත් සෝවාන් පුද්ගලයා කිව්වේ යම් ඵල සිතකට නම්, ඒක හැම වෙලාවේ ම තියෙනවා නේ. ඒකත් ඇතිවෙමින් නැතිවෙමින් පවතිනවා. ඉතින් ඒ නිසා ඒකත් සඞ්ඛත යි. ඒත් සෝවාන් ඵල සමාපත්තියේ කෙනෙක් හිටියා කියන්න. ඒ වුණත් ඒ ඵල සමාපත්තිය කියලා කියන්නේ මේ එක ම සෝවාන් ඵල සිත. එයා පැයක් හිටියා නම් පැය තුළ මේ ඵල සිත තිබුනා ද? නැහැ. එතැනත් වුණේ එබඳු ඵල සිත් ම පැයක් පුරාවට ඇතිවෙමින් නැතිවෙමින් පැවතිච්ච බව තමයි කියන්නේ. අන්න ඒ නිසා අපි ඒ ඵලය ද සංඛත යි. ඇයි?

ඒක ද ස්කන්ධ නිසා හටගත්ත එකක්. ප්‍රත්‍යය නිසා හටගත්ත එකක්. ඒ ප්‍රත්‍යය නැතිවීමෙන් ඒකත් නැතිවෙනවා කියලා ඒ ඵලය ඇතුළේ අපට බලන්න පුළුවන්. සකදාගාමී ඵලය කියන එකත් එහෙම යි. එහෙම ගත්තහම ඒ විදියට අපට ඕනෑම ඵලයක් මේ ඵලය කියන එක ඇතුළේ අපට මේ සඞ්ඛතභාවය අනිත්‍යභාවය, වෙනස්වනභාවය බලන්න පුළුවන්. ඊට පස්සේ යම්කිසිකෙනෙක් අනුපාදා පරිනිර්වාණයට පත්වුණහම මේ සියලු සඞ්ස්කාරයන් නිවීමට ගියා. ඒ නිසාත් මේ සියලු සංස්කාරයෝ අනිත්‍යභාවයට ගියා. දැන් ඔහු නිවනට පත්වුනා. නිවනට පත්වුණහම ඔහු දැන් ඒ අපි වරදවා තේරුම් ගන්නේ. නිවනට පත්වීම නිසා තිබුණු ඵල ටික ඔක්කෝම නැති වුණා කියන අර්ථය ගත්තොත් ආයෙත් වැටෙන්නේ පෘතග්ජනභාවයට නේ. ඉතින් ඒ නිසා එහෙම නෙවෙයි අපි තේරුම්ගන්න ඕන. එතැන යම් ඵලයක් නිසා යම් පත්වීමක් වුණා නම් ඒ නිර්වාණධාතුවට පත්වීම නිසා අර ස්කන්ධ ටික පනවන්න බැහැ. ඒ අර්ථයෙනුත් ඒවා සඞ්ඛත යි. ඒ නිසා ඒවායේ අනිත්‍ය ලක්ෂණයත් තිබුණා. දුක්ඛ ලක්ෂණයත් තිබුණා. ඒ වාගේ ම ඵලයක් ගත්තත්, ඒ ඵලය ඇතුළෙත් අපට මේ සංඛතබව, අනිත්‍යබව බෙදන්න පුළුවන්. අන්න ඒ විදියට තමයි අපි තේරුම්ගන්න ඕන. අර විදියේ බෙදාගන්න ගියොත් අපි පැටලෙන්න පුළුවන්. සෝවාන් ඵලය ඇතිවෙලා සකදාගාමී ඵලය ඇතුවුණහම සෝවාන් ඵලය අනිත්‍ය යි. ඒක නැතිවුණානේ කියලා ගත්තොත් ඒක වැරැදි විග්‍රහයක්.

තෙරුවන් සරණයි.

පිට කවරයේ ඇතුල්පැත්ත.

තවත් උපමාවක් වශයෙන් අපි කිව්වොත් කුඩා දරුවකුගේ මේ නො දන්නාකම නිසා ඒ කුඩා දරුවාට ඕනෑ දෙයක් එයා කරනවා. අශූචි තවරාගන්නවා. කැරපොත්තන් පණුවන්, මේවාත් කටට දාගන්නවා, ගින්දරත් අල්ලනවා, ඒ වාගේ ම අනර්ථය ගෙනැත් දෙන කටයුතු ත් කරනවා. සමහරවිට, සිප්පිකටු, වළංකටු මේවාත් ගිලලා උගුරේ හිරකරගන්නවා. මේ වාගේ නොයෙක් දේවල් කරනවා වාගේ, ලෝක සත්ත්වයාත් අවිද්‍යාව නිසා මුලාවෙන් මුලාවට පත්වෙලා පැටැලිලා, ***අන්තො ජටා බහි ජටා ජටාය ජටිතා පජා,*** කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරේ දේවතා සංයුක්තයේ, අවුලෙන් අවුලට පත්වෙලා පැටැලිලා ඔහේ යන බව දේශනා කළා.